SRI LANKA
IMMIGRATION AND EMIGRATION

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

குடிவரவு, குடியகல்வுத் திணைக்களம்

Department of Immigration & Emigration

# කාර්ය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

# 2015

# <u>පටුන</u>

| නාමාවලිය | පිටුව |
| --- | --- |


✡ හැඳින්වීම 01

✡ කාර්ය මණ්ඩල තොරතුරු 02

✡ දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 03

01. පාලන අංශය 04
    01.1 පාලන ශාඛාව 04
    01.2 පුහුණු හා සංවර්ධන ශාඛාව 05
    01.3 ප්‍රසම්පාදන ශාඛාව 08
02. ගමන් බලපත්‍ර අංශය 09
    02.1 ගමන් බලපත්‍ර ශාඛාව 09
    02.2 ගමන් බලපත්‍ර සැකසීමේ ශාඛාව 14
    02.3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව 15
    02.4 විදේශ දූත මණ්ඩල ශාඛාව 18
    02.5 තැපැල් ශාඛාව 22
03. ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය 24
    03.1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව 24
    03.2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව 26
    03.3 නීති ශාඛාව 27
04. වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය 30
    04.1 වීසා ශාඛාව 30
    04.2 තොටුපල ශාඛාව 34
    04.3 විමර්ශන ශාඛාව 44
05. තොරතුරු තාක්ෂණ අංශය 46
06. ගිණුම් අංශය 48
07. පුරවැසි අංශය 52
08. අභ්‍යන්තර විගණන අංශය 55
09. සුබසාධන කටයුතු 57

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## කාර්ය සාධන වාර්තාව - 2015

## හැඳින්වීම

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතෙහි විධිවිධාන අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුල්වීම පාලනය කිරීම සඳහාත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන වෙනත් පුරවැසියන් හා තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිටවීම විධිමත් කිරීම සඳහාත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම සඳහාත් කටයුතු කිරීමේ බලය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතුවේ. ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම, විදේශයන්හි උපත ලබන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ දරුවන් සඳහා මෙරට පුරවැසිභාවය ලබා දීම මෙන්ම ශ්‍රී ලාංකික පුරවැසිභාවය ඉල්ලුම් කරන ශ්‍රී ලාංකික නොවන තැනැත්තන් සඳහා මෙරට පුරවැසිභාවය ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

### දැක්ම

❖ කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම.

### මෙහෙවර

❖ ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සලසමින්, රටින් බැහැර වන්නන් හා ඇතුළුවන්නන් නියාමනය කිරීම හා පුරවැසි සේවා සැපයීම.

### කාර්යභාරය

ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අනුශාංගික කාර්යයන්

විදේශිකයින් සඳහා වීසා බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අනුශාංගික කාර්යයන්

ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ කාර්යයන්

ප්‍රත්‍යන්ත පාලනය

සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය පරිපාලනය

### නෛතික අධිකාරිය

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1948 අංක 18 දරන පුරවැසි පනත හා එහි සංශෝධන
- 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත සහ ඊට අදාළ සංශෝධන
- 1949 අංක 03 දරන ඉන්දියානු හා පකිස්තානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත
- 1956 ආගාමික හා විගාමික නියෝග සහ ඊට අදාළ සංශෝධන
- 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත (සිරිමා ශාස්ත්‍රීය ගිවිසුම )
- 1988 අංක 39 දරන ආදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රධානය කිරීමේ පනත
- 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රධානය කිරීමේ පනත
- ඉහත පනත් වලට අදාළ සියලුම රෙගුලාසි හා නියෝග
- පාලක ජනරාල් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්


## කාර්ය මණ්ඩල තොරතුරු

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක නිලධාරියා මෙන්ම ගණන් දීමේ නිලධාරියා වශයෙන් පාලක ජනරාල්වරයා වෙත වගකීම පැවරෙන අතර, ඔහුගේ මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ අතිරේක පාලක ජනරාල්වරයකු, පාලකවරුන් 05 දෙනෙකු, ප්‍රධාන ගණකාධිකාරීවරයෙකු හා අභ්‍යන්තර විගණකවරයෙකු වෙත ඒ ඒ අංශවල වගකීම් පැවරී ඇත.

### අනුමත හා සේවයේ නියුතු කාර්ය මණ්ඩල තොරතුරු - 2015

| තනතුර | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| පාලක ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. (විශේෂ) | 01 | 01 | - |
| අතිරේක පාලක ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. (විශේෂ) | 01 | 01 | - |
| පාලක | ශ්‍රී ලං.ප.සේ. I | 05 | 05 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. I | 01 | 01 | - |
| නියෝජ්‍ය/ සහකාර පාලක | ශ්‍රී ලං.ප.සේ. II /III | 39 | 38 | 01 |
| නියෝජ්‍ය/ සහකාර පාලක | දෙපාර්තමේන්තුමය | 10 | 07 | 03 |
| ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. II | 02 | 02 | - |
| අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ. I | 01 | 01 | - |
| පරිපාලන නිලධාරී | රා.ක.ස. අධිපන්තිය | 02 | 02 | - |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | 02 | 01 | 01 |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී | දෙපාර්තමේන්තුමය | 36 | 15 | 21 |
| බලයලත් නිලධාරී | දෙපාර්තමේන්තුමය | 358 | 339 | 19 |
| අයවැය සහකාර | ආශ්‍රිත සේවා | 01 | 01 | - |
| පුහුණු කළමනාකරු | ආශ්‍රිත සේවා | 01 | 01 | - |
| සංවර්ධන නිලධාරී | ආශ්‍රිත සේවා | 20 | 17 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | 368 | 320 | 48 |
| ගමන් බලපත්‍ර සහායක | දෙපාර්තමේන්තුමය | 35 | 31 | 04 |
| නියාමක | දෙපාර්තමේන්තුමය | 02 | 02 | - |
| පිළිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තුමය | 01 | 01 | - |
| රියදුරු | රියදුරු සේවය | 30 | 30 | - |
| කා.සේ.සේ. | කා.සේ.සේවය | 104 | 102 | 02 |
| අනියම් කම්කරු | දෙපාර්තමේන්තුමය | 10 | 05 | 05 |
| **එකතුව** | | **1030** | **923** | **107** |

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



# 01. පාලන අංශය

පාලක (පාලන) ගේ අධීක්ෂණය මත සාමාන්‍ය පරිපාලන කටයුතු, පුහුණු හා මානව සංවර්ධන කටයුතු සහ ප්‍රසම්පාදන කටයුතු මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

## 01 : 1 පාලන ශාඛාව

**කාර්ය මණ්ඩලය**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක (ආයතන) | 01 |
| සහකාර පාලක (නඩත්තු) | 01 |
| පරිපාලන නිලධාරී | 01 |
| භාෂා පරිවර්තක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 18 |
| රියදුරන් | 30 |
| කාර්යාල සේවකයින් | 06 |
| කම්කරුවන් | 05 |

**2015 වසර සඳහා ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.**

1. බඳවා ගැනීම්

   අ. බලයලත් නිලධාරීන් බඳවා ගැනීම්/උසස් කිරීම්

   2015 වර්ෂයට නව බඳවා ගැනීම් නොමැත. 2015.06.03 දින ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් 5 දෙනෙකු සහකාර පාලක තනතුරු සඳහා උසස් කර ඇත.

   ආ. ගමන් බලපත්‍ර සහායක තනතුර සඳහා බඳවා ගැනීම්

   2015 වර්ෂය සඳහා ඇබෑර්තු 04 ක් ඇති අතර, නව බඳවාගැනීම් නොමැත.

2. කාර්යක්ෂමතා කඩඉම් විභාග

   බලයලත් නිලධාරීන්ගේ 2015 වර්ෂය සඳහා අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2015.10.12 හා 2015.10.19 යන දිනයන්හි පවත්වන ලදී.

3. ස්ථාන මාරුවීම් හා විශ්‍රාම ගැනීම් - 2015

| සේවාව | දෙපාර්තමේන්තුවට පැමිණි සංඛ්‍යාව | පිටතට ස්ථාන මාරු වූ සංඛ්‍යාව | විශ්‍රාම ලැබූ සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 07 | 11 | 03 |
| සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) | - | - | 01 |
| බලයලත් නිලධාරී | - | - | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 69 | 45 | 06 |
| කාර්යාල කාර්ය සහායක සේවය | 30 | 21 | 02 |
| රියදුරු සේවය | 10 | 03 | 02 |
| **එකතුව** | **116** | **80** | **16** |

## 01 : 2 පුහුණු හා සංවර්ධන ශාඛාව

පාලක (පාලන) අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| පුහුණු කළමනාකරු | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 03 |
| කාර්යාල සේවකයින් | 01 |

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියළුම නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඊට ගැළපෙන පරිදි මානව සම්පත් සංවර්ධන වැඩසටහන්,

- සැලසුම් කිරීම.
- සංවිධානය කිරීම.
- ක්‍රියාත්මක කිරීම
- අනෙකුත් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම,
- විදේශීය පුහුණුවීම් අවස්ථාවන් හඳුනාගනිමින් ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීම
- පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික ප්‍රතිපාදනයන්ට අමතරව බාහිර ආයතන හා තානාපති කාර්යාල හා ජාත්‍යන්තර සංවිධාන හරහා කාර්ය මණ්ඩල පුහුණු අවස්ථාවන් හඳුනාගනිමින් ඒ හා අදාළ කාර්යයන් ඉටුකිරීම

### 2015 වසරේ පවත්වන ලද පුහුණු වැඩසටහන්

| වැඩමුළුව | පැවැත්වූ දිනය | ඉලක්ක කණ්ඩායම | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| මුහුණු ප්‍රතිරූපයන් සන්සන්දන වැඩසටහන (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | 2015.01.08 | බලයලත් නිලධාරීන් | 25 |
| 2015 වාර්ෂික ස්ථානමාරු ලබා පැමිණි නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | 2015.02.06 සිට 2015.02.12 | කළමනාකරණ සහකාර නිලධාරීන් සහ කාර්යාල කාර්ය සහායකයින් සඳහා | 20 |
| මුහුණු ප්‍රතිරූපයන් සන්සන්දන වැඩසටහන (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | 2015.02.10 සිට 2015.02.13 | බලයලත් නිලධාරීන් | 100 |
| මුහුණු ප්‍රතිරූපයන් සන්සන්දන වැඩසටහන (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | 2015.02.16 සිට 2015.02.17 | බලයලත් නිලධාරීන් | 11 |
| ජෛවමිතික ගමන් බලපත්‍ර පිළිබඳව ඡායාරූපශාලා හිමියන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන - කොළඹ | 2015.03.10 | ලියාපදිංචි ඡායාරූප ශාලා හිමියන් | 480 |
| ජෛවමිතික ගමන් බලපත්‍ර පිළිබඳව ඡායාරූපශාලා හිමියන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන - කොළඹ | 2015.03.13 | ලියාපදිංචි ඡායාරූප ශාලා හිමියන් | 625 |

| වැඩමුළුව | පැවැත්වූ දිනය | ඉලක්ක කණ්ඩායම | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| ජෛවමිතික ගමන් බලපත්‍ර පිළිබඳව ඡායාරූපශාලා හිමියන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන - වවුනියාව | 2015.03.26 | ලියාපදිංචි ඡායාරූප ශාලා හිමියන් | 100 |
| ජෛවමිතික ගමන් බලපත්‍ර පිළිබඳව ඡායාරූපශාලා හිමියන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන - මාතර | 2015.03.28 | ලියාපදිංචි ඡායාරූප ශාලා හිමියන් | 170 |
| ජෛවමිතික ගමන් බලපත්‍ර පිළිබඳව ඡායාරූපශාලා හිමියන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන - මහනුවර | 2015.04.01 | ලියාපදිංචි ඡායාරූප ශාලා හිමියන් | 425 |
| ජෛවමිතික ගමන් බලපත්‍ර පිළිබඳව ඡායාරූපශාලා හිමියන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන - මඩකලපුව | 2015.04.02 | ලියාපදිංචි ඡායාරූප ශාලා හිමියන් | 130 |
| වාර්ෂික ස්ථානමාරු ලබා පැමිණි නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | 2015.05.11 සිට 2015.05.18 දක්වා | කළමනාකරණ සහකාර නිලධාරීන් සහ කාර්යාල කාර්ය සහායකයින් සඳහා | 32 |
| ගමන් බලපත්‍ර අංශයේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන (ශ්‍රී ලංකා පදනම් ආයතනය, කොළඹ) | 2015.06.06 | ගමන් බලපත්‍ර අංශයේ සේවයේ නියුතු සියළුම නිලධාරීන් | 150 |
| රියදුරු කාර්ය මණ්ඩලයේ වෘත්තීය කුසලතා ප්‍රවර්ධනය කිරීමේ වැඩමුළුව (ශ්‍රී ලංකා පදනම් ආයතනය, කොළඹ) | 2015.06.20 | රියදුරු සේවයේ සියළුම නිලධාරීන් | 30 |
| ජෛවමිතික ගමන් බලපත්‍රය පිළිබඳ අත්පොත සැදීම (මීගමුව) | 2015.07.04 සහ 2015.07.05 | මාණ්ඩලික නිලධාරීන් සහ සම්පත් දායකයින් | 50 |
| ජෛවමිතික ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධව ඇඟිලි සලකුණු ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව අදාල නිලධාරීන් පුහුණු කිරීම (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | 2015.07.10 සිට 2015.07.17 දක්වා | ගමන් බලපත්‍ර හා පරිගණක අංශයට අදාල නිලධාරීන් | 150 |
| අද්විතීය පාරිභෝගික සත්කාරය සම්බන්ධ පුහුණු වැඩසටහන ("සව්සිරිපාය", විජේරාම මාවත, කොළඹ 07) | 2015.07.18 | විධායක, මාණ්ඩලික, රාජ්‍ය කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරීන් සහ කාර්යාල කාර්ය සහායක කාර්ය මණ්ඩලය. | 160 |
| ජෛවමිතික ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ නව ක්‍රියාවලිය දැනුවත් කිරීමේ වැඩමුළුව (ශ්‍රී ලංකා පදනම් ආයතනය, කොළඹ) | 2015.07.28 | ප්‍රාදේශීය ලේකම්වරුන් සහ එම කාර්යාලවල නියෝජිතයින් | 315 |

| වැඩමුළුව | පැවැත්වූ දිනය | ඉලක්ක කණ්ඩායම | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| ලියවිලි පරීක්ෂාව පිළිබඳ ඇමෙරිකානු සහ කැනේඩියානු තානාපති කාර්යාල නිලධාරීන් විසින් පවත්වන පුහුණු වැඩසටහන (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | 2015.08.10 සිට 2015.08.13 දක්වා | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් සහ බලයලත් නිලධාරීන් | 30 |
| ඵලදායිතා ප්‍රවර්ධන වැඩමුළුව (යහපත් ආකල්ප තුලින් වඩාත් සුහදශීලී මහජන සේවයක්) (ICTAD) | 2015.08.26 | බලයලත් නිලධාරීන් | 57 |
| ඵලදායිතා ප්‍රවර්ධන වැඩමුළුව (ICTAD) | 2015.09.04 | බලයලත් නිලධාරීන් | 34 |
| ඵලදායිතා ප්‍රවර්ධන වැඩමුළුව (ICTAD) | 2015.09.11 | බලයලත් නිලධාරීන් | 47 |
| ලියවිලි පරීක්ෂාව පිළිබඳ ඇමෙරිකානු සහ කැනේඩියානු තානාපති කාර්යාල නිලධාරීන් විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන. (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | 2015.09.14 සිට 2015.09.17 දක්වා | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් සහ බලයලත් නිලධාරීන් | 40 |
| ඵලදායිතා ප්‍රවර්ධන වැඩමුළුව (හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, විජේරාම මාවත, කොළඹ 07) | 2015.09.18 | බලයලත් නිලධාරීන් | 50 |
| ලියවිලි පරීක්ෂාව පිළිබඳ ඇමෙරිකානු සහ කැනේඩියානු තානාපති කාර්යාල නිලධාරීන් විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන. (පුහුණු හා සංවර්ධන අංශ ශ්‍රවණාගාරය) | 2015.10.21 සිට 2015.10.23 දක්වා | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් සහ බලයලත් නිලධාරීන් | 60 |
| ලියවිලි පරීක්ෂාව පිළිබඳ ඇමෙරිකානු සහ කැනේඩියානු තානාපති කාර්යාල නිලධාරීන් විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන. | 2015.12.21 සහ 2015.12.22 | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් සහ බලයලත් නිලධාරීන් | 45 |
| ඵලදායිතා ප්‍රවර්ධන වැඩමුළුව (හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, විජේරාම මාවත, කොළඹ 07) | 2015.12.28 | බලයලත් නිලධාරීන් | 60 |

මීට අමතරව 2015 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා දෙමළ භාෂා පන්ති පවත්වන ලදී.

## 01 : 3 ප්‍රසම්පාදන ශාඛාව

පාලක (පාලන) අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක (ප්‍රසම්පාදන) | 01 |
| සංවර්ධන නිලධාරීන් | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 02 |

2015 වර්ෂය සඳහා ප්‍රසම්පාදනය කරන ලද උපකරණවල වටිනාකම පහත පරිදි වේ.

| ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩයේ නම | භාණ්ඩවල වටිනාකම (රු.) |
|---|---|
| කාර්යාලීය උපකරණ | 577,002.50 |
| වායුසමීකරණ යන්ත්‍ර | 7,122,886.26 |
| මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර | 2,197,940.00 |
| පරිගණක පද්ධතියට අදාල උපකරණ | 18,713,079.99 |
| ස්කෑනර් යන්ත්‍ර | 2,332,000.00 |
| **එකතුව** | 30,942,908.75 |

## 2. ගමන් බලපත්‍ර අංශය

පාලක (ගමන් බලපත්‍ර) යටතේ ප්‍රධාන වශයෙන් ගමන් බලපත්‍ර ශාඛාව, ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව, ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව, විදේශ දූත මණ්ඩල ශාඛාව හා තැපැල් ශාඛාව ක්‍රියාත්මක වේ.

### 02 : 1 ගමන් බලපත්‍ර ශාඛාව

මෙම දෙපාර්තමේන්තුවේ සේවය ලබා ගැනීමට මහජනයා වැඩිපුරම පැමිණෙන ශාඛාව ගමන් බලපත්‍ර ශාඛාව වේ. විදේශ රැකියා, සංචාර, වෛද්‍ය ප්‍රතිකාර ආදී විවිධ වූ අවශ්‍යතාවයන් මත ගමන් බලපත්‍ර අයදුම්කරන අයදුම්කරුවන් වෙත ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත නිවැරදි තොරතුරු ඇතුලත් ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම මෙම ශාඛාවෙන් සිදු කරයි. ප්‍රධාන කාර්යාලයේ ගමන් බලපත්‍ර ශාඛාවට අමතරව මහනුවර, වවුනියාව හා මාතර ලෙස ප්‍රාදේශීය කාර්යාල 03ක් පිහිටුවා ඇති අතර, 2015 වසරේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගමන් බලපත්‍ර අයදුම්පත් භාරගැනීම අත්හිටුවන ලදී.

මෙම ශාඛාව පාලක (ගමන් බලපත්‍ර) අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 18 |
| සංවර්ධන නිලධාරීන් | 09 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 39 |
| කාර්යාල සේවකයින් | 24 |

**ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය - 2015**

**ප්‍රධාන කාර්යාලය**

| රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරි | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|
| 471 | 1,305 | 234,138 | 161,451 | 15,330 | 2 | **412,691** |

**ප්‍රාදේශීය කාර්යාල**

| | රාජකාරී | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික (දඹදිව යාම) | එකතුව |
|---|---|---|---|---|---|
| **මහනුවර** | 5 | 25,697 | 8,564 | 7,306 | **41,572** |
| **වවුනියාව** | - | 13,830 | 4,721 | 650 | **19,201** |
| **මාතර** | 3 | 13,773 | 2,227 | 1,894 | **17,897** |


## 2015 වර්ෂයේ නිකුත් කරන ලද සියළුම ගමන් බලපත්‍ර සංඛ්‍යාව

| රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරි | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|
| **471** | **1313** | **287,438** | **176,963** | **25,180** | **2** | **491,367** |

## 2011 සිට 2015 දක්වා ගමන් බලපත්‍ර නිකුත් කිරීම් (ගමන් බලපත්‍ර වර්ග අනුව)

| වර්ෂය | රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරි | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2011 | 358 | 995 | 285,724 | 196,516 | 39,611 | 8 | 523,212 |
| 2012 | 288 | 899 | 303,524 | 230,482 | 35,697 | 4 | 570,894 |
| 2013 | 338 | 998 | 284,231 | 214,352 | 17,611 | 6 | 517,536 |
| 2014 | 309 | 1,043 | 234,943 | 198,815 | 14,786 | 6 | 449,902 |
| 2015 | 471 | 1313 | 287,438 | 176,963 | 25,180 | 2 | 491,367 |

## 2011 සිට 2015 දක්වා ගමන් බලපත්‍ර නිකුත් කිරීම්



## ඉටු කරන ලද විශේෂිත කාර්යයන්

### ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට ජෛවමිතික දත්ත ඇතුලත් කිරීමේ ව්‍යාපෘතිය

මෙමගින් ගමන් බලපත්‍ර අයදුම් කරන්නන්ගේ ගුණාත්මක බවින් ඉහල ඡායාරූපයක් මාර්ගගත (Online) ආකාරයෙන් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට සෘජුවම ලබාගැනීමේ ක්‍රමවේදයක් ඇති කරන ලදී. ජෛවමිතික (ඇඟිලි සලකුණු හා ඡායාරූප) යොදාගනිමින් ගමන් බලපත්‍ර සකස් කිරීම ආරම්භ කිරීම නිසා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය වඩාත් සුරක්ෂිත හා සාර්ථක ලෙස නිම කිරීමට හැකි විය.

2. ව්‍යාපෘතියේ අරමුණු -

   i. එක් පුද්ගලයකුට වෙනස් අනන්‍යතාවයක් ඉදිරිපත් කරමින් ගමන් බලපත්‍ර එකකට වඩා වැඩි සංඛ්‍යාවක් ලබා ගැනීමට ඇති හැකියාව ඉවත් කිරීම
   ii. අවිධිමත් ලෙස විදේශ රටවලට සංක්‍රමණය වීම, පුද්ගලයින් ජාවාරම් කිරීම හා ත්‍රස්තවාදී කටයුතු වලට සම්බන්ධ ක්‍රියා ඇතුළු විවිධ ආකාරයේ දේශ සීමාවලින් පිටත සිදු කරන අපරාධ කටයුතු සඳහා ශ්‍රී ලංකා ගමන් බලපත්‍රය අවභාවිතය අවම කිරීම

ජෛවමිතික ගමන් බලපත්‍ර ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස ගමන් බලපත්‍ර සඳහා ලබා ගන්නා ඡායාරූප ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ප්‍රමිතීන්ට අනුකූලව ලබා ගැනීම, එම ඡායාරූප මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය වෙත යොමු කිරීම, ගමන් බලපත්‍ර අයදුම් කරුවන්ගේ ජීව දත්ත ලබා ගැනීම හා එම දත්ත දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියේ ගබඩා කිරීම සිදුකෙරේ.

ව්‍යාපෘතියේ දෙවන අදියර ලෙස අයදුම්කරුවකු ගමන් බලපත්‍රයක් සඳහා අයදුම් කිරීමේදී එම පුද්ගල දත්ත හා ඇඟිලි සලකුණු දත්ත දෙපාර්තමේන්තුවේ දත්ත ගබඩාවේ ජීව දත්ත ඇතුළු සියළුම දත්තයන් හා සැසඳීම සිදුකෙරේ.

ඒ අනුව ව්‍යාපෘතියේ ප්‍රථම අදියරේ එක් අංගයක් ලෙස 2014.12.31 දිනට සුදුසුකම් සපුරන ලද ඡායාරූපශාලා 1547 සඳහා සමාරම්භක දැනුවත් කිරීමේ වැඩමුළු 08ක් කොළඹ, වවුනියාව, මහනුවර, මාතර හා මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි 2015 මාර්තු මස 10 දින සිට අප්‍රේල් මස 02 දින දක්වා දින 05ක් පුරා පවත්වන ලදී.

**ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට ජෛවමිතික දත්ත ඇතුලත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අයදුම් කළ, ලියාපදිංචි වූ හා සම්බන්ධ වූ ඡායාරූප ශාලා ගණන 2015-12-31 දිනට**

| පළාත | දිස්ත්‍රික්කය | අයදුම් කළ සංඛ්‍යාව | ලියාපදිංචි වූ සංඛ්‍යාව | සම්බන්ධ වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ | 379 | 346 | 221 |
| | ගම්පහ | 267 | 251 | 148 |
| | කළුතර | 101 | 92 | 43 |
| මධ්‍යම පළාත | මහනුවර | 99 | 94 | 62 |
| | මාතලේ | 29 | 28 | 16 |
| | නුවරඑළිය | 34 | 30 | 17 |
| නැගෙනහිර පළාත | අම්පාර | 51 | 48 | 32 |
| | මඩකලපුව | 43 | 35 | 21 |
| | ත්‍රිකුණාමලය | 20 | 20 | 8 |
| සබරගමුව පළාත | කෑගල්ල | 54 | 53 | 38 |
| | රත්නපුර | 93 | 85 | 60 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 44 | 42 | 23 |
| | පොලොන්නරුව | 18 | 16 | 10 |
| ඌව පළාත | බදුල්ල | 35 | 31 | 16 |
| | මොණරාගල | 29 | 27 | 9 |
| වයඹ පළාත | කුරුණෑගල | 160 | 154 | 95 |
| | පුත්තලම | 73 | 68 | 44 |
| දකුණු පළාත | ගාල්ල | 143 | 133 | 54 |
| | මාතර | 75 | 66 | 38 |
| | හම්බන්තොට | 41 | 34 | 11 |
| උතුරු පළාත | යාපනය | 23 | 23 | 10 |
| | කිලිනොච්චි | 4 | 4 | 3 |
| | මන්නාරම | 8 | 6 | 5 |
| | මුලතිව් | 0 | 0 | 0 |
| | වවුනියාව | 4 | 4 | 4 |
| **එකතුව** | | **1827** | **1690** | **988** |

2015-12-31 දින වන විට දෙපාර්තමේන්තුව වෙත ඡායාරූප ශාලා ලියාපදිංචිය සඳහා අයදුම්පත් 1827 ක් එවා තිබූ අතර, ඉන් ඡායාරූප ශාලා 1690 ක් මුදල් ගෙවා තම ලියාපදිංචිය තහවුරු කර ඇත. එයින් සුදුසුකම් සම්පූර්ණ කරන ලද ඡායාරූප ශාලා 1154 ක් අතුරින් 988 ක් නිරීක්ෂණ කටයුතු අවසන් කොට දෙපාර්තමේන්තුව සමග මාර්ගගත ක්‍රමවේදය යටතේ (Online) සම්බන්ධ කර ඇත. ඒ අනුව 166 ක් වන ඉතිරි ඡායාරූප ශාලා 2016 වර්ෂය තුල නිරීක්ෂණ කටයුතු සම්පූර්ණ කිරීමට සූදානම් කර ඇත.

## ගමන් බලපත්‍ර අයදුම්පත් භාරගැනීමේ ජංගම ඒකකය

ජෛවමිතික ගමන් බලපත්‍ර ව්‍යාපෘතිය යටතේ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ නව ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමත් සමග පුද්ගලයකුට ගමන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවට පැමිණ ඇඟිලි සලකුණු ලබා දීම අත්‍යාවශ්‍ය කරුණක් බවට පත්විය. විශේෂ ප්‍රභූ පුද්ගලයන් සඳහා සහ දෙපාර්තමේන්තුවට පැමිණිය නොහැකි විශේෂිත රෝග හා අශක්නුතා ඇති පුද්ගලයන් සඳහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමට ජංගම ඒකකය හඳුන්වා දෙන ලදී.

ජෛවමිතික ගමන් බලපත්‍ර ව්‍යාපෘතිය ආරම්භ කල 2015-08-10 වන දින සිට 2015-12-31 දින දක්වා පුද්ගලයින් 30 දෙනෙකු සඳහා ජංගම ඒකකය භාවිතා කර ගමන් බලපත්‍ර සකසන ලදී.

## 02 : 2 ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව

පාලක (ගමන් බලපත්‍ර) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

ගමන් බලපත්‍ර ශාඛාවෙන් සහ විදේශ දූත මණ්ඩල ශාඛාවෙන් නව ගමන් බලපත්‍ර සකස් කිරීම සඳහා සැකසුම් ශාඛාව වෙත යොමුවන අයදුම්පත්‍ර අදාල පරීක්ෂාකිරීම් වලින් අනතුරුව පහත සඳහන් පරිදි කටයුතු කරනු ලබයි.

දත්ත ඇතුලත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate), ඡායාරූප හා අත්සන් පරිලෝඛණය කිරීම (Capture), මුද්‍රණය කිරීම (Print), මුද්‍රණය කරන ලද ගමන් බලපත්‍ර වල වෙනස් කිරීම් සහ නිරීක්ෂණ ඇතොත් ඒවා 4 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print), තත්ව පාලනය කිරීම (Quality Assurance), ගමන් බලපත්‍ර ලැමිනේටින් කිරීම, පරීක්ෂා කිරීම, සැසඳීම හා 4 වන පිටුව ස්කෑන් කිරීම (Compare & 4th Page Scan) සහ අවසාන තත්ව පරීක්ෂාව (Quality Control) සිදුකර ඉන් අනතුරුව එක්දින සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත්‍ර ගමන් බලපත්‍ර ශාඛාවටත්, සාමාන්‍ය සේවා යටතේ නිකුත් කරන ගමන් බලපත්‍ර තැපැල් ශාඛාවටත්, විදේශ දූත මණ්ඩල වලට යැවිය යුතු ගමන් බලපත්‍ර විදේශ දූත මණ්ඩල ශාඛාවටත් යවනු ලබයි.

සංශෝධන ශාඛාවෙන් ගමන් බලපත්‍ර සංශෝධන කටයුතු සඳහා යොමු කරන අයදුම්පත්‍ර අදාල පරීක්ෂාකිරීම් වලින් අනතුරුව දත්ත ඇතුලත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate) හා සංශෝධන 4 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print) සිදු කරනු ලබයි.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 02 |
| සංවර්ධන නිලධාරීන් | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 46 |
| ගමන් බලපත්‍ර සහායක නිලධාරීන් | 19 |
| කාර්යාල සේවකයින් | 09 |

## 02 : 3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව

පාලක (ගමන් බලපත්‍ර) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 06 |
| කාර්යාල සේවකයින් | 02 |


**ගමන් බලපත්‍ර සංශෝධනය - 2015**

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| එක් විදේශ ගමනකට වලංගු කිරීම | 397 |
| තනි ගමන් සීමාව අවලංගු කිරීම | 1289 |
| ද්විත්ව පුරවැසිභාවය ඇතුලත් කිරීම | 209 |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයට දරුවන් ඇතුළත් කිරීම | 794 |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයෙන් දරුවන් ඉවත් කිරීම | 2190 |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයට දරුවන්ගේ අළුත් ඡායාරූප ඇතුළත් කිරීම | 47 |
| හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම | 2003 |
| විවාහයට පෙර නම යෙදීම | 48 |
| විවාහයට පසු නම යෙදීම | 1898 |
| නම වෙනස් කිරීම | 3265 |
| නම මාරුකිරීම(වෙනත්) | 2 |
| තනතුර සටහන් කිරීම | 54400 |
| තනතුර සටහන් කිරීම(ගාස්තු රහිත) | 880 |
| වෙනත් සංශෝධන(ගාස්තු රහිත) | 9 |
| වෙනත් සංශෝධන 01 | 20844 |
| වෙනත් සංශෝධන 02 | 330 |
| වෙනත් සංශෝධන 03 | 7 |
| **එකතුව** | **88612** |

# ගමන් බලපත්‍ර සංශෝධනය (2011 සිට 2015 දක්වා)

| වර්ගය | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| සියලු රටවල් සඳහා වලංගු කිරීම | 15,746 | 1,496 | 2,557 | 473 | - |
| එක් විදේශ ගමනකට වලංගු කිරීම | 957 | 667 | 541 | - | 397 |
| තනි ගමන් සීමාව අවලංගු කිරීම | 1,356 | 1,264 | 1,309 | 1151 | 1289 |
| කාලය දීර්ඝ කිරීම | 59,084 | 28,740 | 10,384 | 2,368 | - |
| ද්විත්ව පුරවැසිභාවය ඇතුලත් කිරිම | - | - | - | 11 | 209 |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයට ළමයින් ඇතුළත් කිරීම | 2,529 | 2,207 | 1,856 | 1496 | 794 |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයෙන් දරුවන් ඉවත් කිරීම | 2,659 | 2,656 | 2,361 | 2219 | 2190 |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයට දරුවන්ගේ අළුත් ඡායාරූප ඇතුළත් කිරීම | 118 | 93 | 137 | 135 | 47 |
| හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම | 1,906 | 1,496 | 1,671 | 2070 | 2003 |
| විවාහයට පෙර නම යෙදීම | 24 | 34 | 40 | 16 | 48 |
| විවාහයට පසු නම යෙදීම | 2,211 | 2,224 | 2,036 | 2033 | 1898 |
| නම වෙනස් කිරීම | 4,449 | 3,984 | 3,399 | 3119 | 3265 |
| නම මාරුකිරීම (වෙනත්) | 0 | 2 | 7 | 3 | 2 |
| තනතුර සටහන් කිරීම | 46,542 | 47,347 | 55,655 | 66,922 | 54400 |
| තනතුර සටහන් කිරීම (ගාස්තු රහිත) | 1 | 2 | 2 | - | 880 |
| වෙනත් සංශෝධන (ගාස්තු රහිත) | 121 | 137 | 151 | 81 | 9 |
| වෙනත් සංශෝධන 01 | 29,043 | 33,316 | 27,462 | 28,669 | 20844 |
| වෙනත් සංශෝධන 02 | 1,418 | 1,363 | 995 | 913 | 330 |
| වෙනත් සංශෝධන 03 | 56 | 28 | 27 | 17 | 7 |
| **එකතුව** | **168,220** | **127,056** | **110,590** | **111,696** | **88612** |

දෙමාපියන්ගේ ගමන් බලපත්‍ර සඳහා ළමුන් ඇතුලත් කිරීම 2015.08.10 දිනෙන් පසුව නවතා ඇත. ඒ අනුව එදිනෙන් පසු වයස් භේදයකින් තොරව සෑම කෙනෙකුම වෙනම ගමන් බලපත්‍රයක් ලබා ගත යුතුය.



## 02 : 4 විදේශ දූත මණ්ඩල ශාඛාව

පාලක (ගමන් බලපත්‍ර) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 01 |
| සංවර්ධන නිලධාරීන් | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 15 |
| ගමන් බලපත්‍ර සහායක | 01 |
| කාර්යාල සේවකයින් | 04 |

### ඉටු කරන ලද කාර්යයන්

* විදේශ දූතමණ්ඩල වලින් ලැබෙන අයදුම්පත් වලට අදාල ගමන් බලපත් නිකුත් කිරීම.

* තාවකාලික ගමන් බලපත්‍ර නිකුත් කිරීමට සහ විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ ගමන් බලපත් වල සංශෝධන සඳහා අනුමැතිය ලබාදීම.


* විදේශ දූතමණ්ඩල විසින් ඉල්ලා ඇති අවස්ථාවල විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ ගමන් බලපත් වලට අදාල නිරවද්‍යතාවය තහවුරු කරමින් වාර්තා ලබා දීම.

**මෙම ශාඛාව මගින් නිකුත් කරන ලද ගමන් බලපත්‍ර - 2015**

| මාසය | සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 2027 |
| පෙබරවාරි | 3152 |
| මාර්තු | 3551 |
| අප්‍රේල් | 4082 |
| මැයි | 3052 |
| ජුනි | 3573 |
| ජූලි | 3497 |
| අගෝස්තු | 3951 |
| සැප්තැම්බර් | 3307 |
| ඔක්තෝම්බර් | 3112 |
| නොවැම්බර් | 1833 |
| දෙසැම්බර් | 1908 |
| එකතුව | 37045 |

## 2011 වසර සිට 2015 වසර දක්වා  නිකුත් කරන ලද ගමන් බලපත්‍ර පිළිබඳ විස්තර

| මාසය | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| ජනවාරි | 2385 | 2813 | 2117 | 2829 | 2027 |
| පෙබරවාරි | 1815 | 1731 | 2225 | 3312 | 3152 |
| මාර්තු | 3037 | 3752 | 3329 | 3768 | 3551 |
| අප්‍රේල් | 3387 | 3426 | 3298 | 3446 | 4082 |
| මැයි | 5190 | 3785 | 3219 | 2921 | 3052 |
| ජුනි | 3931 | 3770 | 4256 | 3346 | 3573 |
| ජූලි | 3073 | 3169 | 3271 | 3858 | 3497 |
| අගෝස්තු | 2773 | 2956 | 1027 | 3329 | 3951 |
| සැප්තැම්බර් | 2304 | 2609 | 3524 | 3297 | 3307 |
| ඔක්තෝම්බර් | 2050 | 3343 | 3015 | 3632 | 3112 |
| නොවැම්බර් | 2825 | 2610 | 3918 | 2010 | 1833 |
| දෙසැම්බර් | 2213 | 2721 | 2512 | 4080 | 1908 |
| **එකතුව** | **34983** | **36685** | **35711** | **39828** | **37045** |



# විදේශ දූත මණ්ඩල මගින් ලද ගමන් බලපත්‍ර අයදුම්පත් - 2015

| රට | | තානාපති කාර්යාලය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | සියළුම රටවල් | මැදපෙරදිග |
| 1 | ඕස්ට්‍රේලියා | කැන්බරා | 590 | |
| | | මෙල්බර්න් | 1161 | |
| | | සිඩ්නි | 433 | |
| 2 | ඔස්ට්‍රියා | වියානා | 25 | |
| 3 | බහරේන් | මනමා | 100 | 494 |
| 4 | බන්ග්ලාදේශය | ඩකා | 44 | |
| 5 | බෙල්ජියම | බ්‍රසල්ස් | 29 | |
| 6 | බ්‍රසීලය | බ්‍රසීලියා | 3 | |
| 7 | කැනඩාව | ඔටාවා | 424 | |
| | | ටොරන්ටෝ | 1119 | |
| 8 | චීනය | බීජින් | 58 | |
| | | ගුන්ෂු | 4 | |
| | | ෂැන්හයි | 1 | |
| | | චෙන්ඩු | 2 | |
| 9 | කියුබාව | හවානා | 1 | |
| 10 | ඊජිප්තුව | කයිරෝ | 40 | |
| 11 | ප්‍රංශය | පැරිස් | 2825 | |
| 12 | ජර්මනිය | බර්ලින් | 403 | |
| | | ෆ්‍රැන්ක්ෆර්ට් | 1214 | |
| 13 | ඉන්දියාව | නවදිල්ලිය | 18 | 2 |
| | | චෙන්නායි | 178 | 1 |
| | | මුම්බායි | 10 | 3 |
| 14 | ඉන්දුනීසියාව | ජකර්තා | 11 | |
| 15 | ඉරානය | ටෙහෙරාන් | 5 | |
| 16 | ඉරාකය | බැග්ඩෑඩ් | 4 | |
| 17 | ඊශ්‍රායලය | ටෙල් අවීව් | 325 | |
| 18 | ඉතාලිය | රෝමය | 5046 | |
| 19 | ජපානය | ටෝකියෝ | 472 | |
| 20 | ජෝර්දානය | අම්මාන් | 18 | 389 |
| 21 | කෙන්යාව | නයිරෝබි | 18 | |
| 22 | කොරියාව | සෝල් | 764 | |
| 23 | කුවේට් | කුවේට් | 242 | 4413 |
| 24 | ලෙබනන් | බීරුට් | 27 | 479 |

| රට | | තානාපති කාර්යාලය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | සියළුම රටවල් | මැදපෙරදිග |
| 25 | මැලේසියාව | ක්වාලාලම්පූර් | 247 | |
| 26 | මාලදිවයින | මාලේ | 24 | 56 |
| 27 | මියන්මාරය | යොන්ගොන් | 2 | |
| 28 | නේපාලය | කත්මන්ඩු | 3 | |
| 29 | නෙදර්ලන්තය | හේග් | 43 | |
| 30 | නයිජීරියාව | නයිජීරියා | 6 | |
| 31 | නෝර්වේ | ඔස්ලෝ | 84 | |
| 32 | ඕමානය | මස්කට් | 142 | 352 |
| 33 | පාකිස්තානය | ඉස්ලාමාබාද් | 12 | |
| | | කරච්චි | 23 | 19 |
| 34 | පිලිපීනය | මැනිලා | 15 | |
| 35 | පෝලන්තය | වර්සෝ | 3 | |
| 36 | කටාර් | කටාර් | 613 | 3255 |
| 37 | රුසියාව | මොස්කව් | 21 | |
| 38 | සවුදි අරාබිය | රියාද් | 244 | 2255 |
| | | ජෙඩා | 100 | 836 |
| 39 | සීෂෙල්ස් | වික්ටෝරියා | 18 | |
| 40 | සිංගප්පූරුව | සිංගප්පූරුව | 197 | |
| 41 | දකුණු අප්‍රිකාව | පිටෝරියා | 82 | |
| 42 | ස්වීඩනය | ස්ටෝක්හොම් | 138 | |
| 43 | තායිලන්තය | බැංකොක් | 20 | |
| 44 | තුර්කිය | අන්කරා | 4 | |
| 45 | උගන්ඩාව | කම්පලා | 17 | |
| 46 | එක්සත් අරාබි එමීර් | අබුඩාබි | 218 | 817 |
| | | ඩුබායි | 1065 | 2253 |
| 47 | එක්සත් රාජධානිය | ලන්ඩන් | 2147 | |
| 48 | ස්විට්සර්ලන්තය | ජිනීවා | 1232 | |
| 49 | ඇමෙරිකා එක්සත් ජනපදය | නිව්යෝක් | 260 | |
| | | වොෂින්ටන් | 512 | |
| | | ලොස්ඇන්ජලීස් | 245 | |
| 50 | වියට්නාමය | හැනොයි | 3 | |
| **එකතුව** | | | **23354** | **15624** |
| **මුළු එකතුව** | | | **38978** | |

## 02 : 5 තැපැල් ශාඛාව

සාමාන්‍ය සේවය යටතේ භාර දී ඇති ඉල්ලුම්පත්‍ර වලට අදාල ගමන් බලපත්‍ර සකසා අවසන් වූ පසු අයදුම්කරුවන්ගේ ලිපිනයන් වෙත ලියාපදිංචි තැපැල් මගින් යැවීම හා සාමාන්‍ය සේවය යටතේ භාර දී ඇති ඉල්ලුම්පත්‍ර වලට අදාල ගමන් බලපත්‍ර කඩිනම් කර ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් වලදී "එදින නිකුත් කිරීම්" ක්‍රමය යටතේ සකස්කර භාර දීම මෙම ශාඛාවේ ප්‍රධාන කාර්යය වේ.

පාලක (ගමන් බලපත්‍ර) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**


| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 07 |
| නියාමක නිලධාරී | 01 |
| කාර්යාල සේවකයින් | 03 |

**තැපැල් කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව මාසිකව - 2015**

| මාසය | ගමන් බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 4,185 |
| පෙබරවාරි | 4,535 |
| මාර්තු | 7,284 |
| අප්‍රේල් | 5,387 |
| මැයි | 4,533 |
| ජූනි | 7,988 |
| ජූලි | 6,561 |
| අගෝස්තු | 6,722 |
| සැප්තැම්බර් | 7,225 |
| ඔක්තෝම්බර් | 6,875 |
| නොවැම්බර් | 6,328 |
| දෙසැම්බර් | 4,194 |
| **එකතුව** | **71,817** |

**<u>තැපැල් කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව 2011 – 2015</u>**

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| ගමන් බලපත්‍ර සංඛ්‍යාව | 91,089 | 85,957 | 70,961 | 69,768 | 71,817 |



# 03. ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ)/ නියෝජ්‍ය කොමසාරිස් (ඉන්දු ලංකා) යටතේ ප්‍රධාන වශයෙන් ඉන්දු ලංකා පුරවැසි ශාඛාව, ප්‍රතිපත්ති හා සංවර්ධන ශාඛාව හා නීති ශාඛාව ක්‍රියාත්මක වේ.

## 03 : 1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව

පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 02 |
| කාර්යාල සේවකයින් | 01 |

## 2015 වසරේ දී ඉටුකළ කාර්යයන්,

01. 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සකස් කිරිම
02. 2014 වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව සකස් කිරිම
03. දෙපාර්තමේන්තුව මඟින් අනෙකුත් ආයතනවලට යැවිය යුතු මාසික හා කාර්තු ප්‍රගති වාර්තා සකස් කිරීම.
04. ප්‍රාග්ධන හා අනෙකුත් ව්‍යාපෘති ප්‍රගතිය සම්බන්ධීකරණය, මෙහෙයවීම හා අධීක්ෂණය කිරිම.
05. අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සමග ප්‍රතිපත්ති කටයුතු වලට අදාල රාජකාරි සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරිම.
06. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව අනුව අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම.

## 2015 වසරේ දී ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ

01. රාජ්‍යතාන්ත්‍රික සහ රාජකාරි විදේශ ගමන් බලපත්‍ර හිමි පුද්ගලයින් වීසා අවසරපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අත්සන් කරනු ලබන ගිවිසුම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.
02. ජෛවමිතික (ඇඟිලි සළකුණු හා ඡායාරූප) තොරතුරු ඇතුලත් ශ්‍රී ලාංකික විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

03. බත්තරමුල්ලෙහි ඉදිකරනු ලබන පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල තුළ ආගමන විගමන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

04. විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය හා පුද්ගලාරෝපණය කිරීමේ පරිගණක පද්ධතිය සඳහා වූ ආපදා ප්‍රතිකර්මීය උපස්ථක මධ්‍යස්ථානයේ කටයුතු සමාප්ත කිරීම සඳහා සහ අදාල ගෙවීම් කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය.

05. ආගමන විගමන දෙපාර්තමේන්තුව සඳහා රජය සතු ගම්පහ, කටාන, කළුදියවලවත්ත ඉඩමෙන් පර්චස් 100 ක බිම් කොටසක් ලබා ගැනීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය.

06. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිඇණවුමක් වශයෙන් මිලියන 1.5 ක් වන “එන්” කාණ්ඩයේ හිස් ගමන් බලපත්‍ර (ගමන් ලියවිලි) ප්‍රසම්පාදනය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

07. ගුවන් මගීන් පෙර ක්‍රියාවලිගත කිරීමේ සහ මගී නාම වාර්තා ලබා ගැනීමේ පද්ධතියක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

08. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් සඳහා සේවා ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

09. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ හා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයන් මෙන්ම වයඹ සංවර්ධන අධිකාරිය හා වයඹ ලේකම් කාර්යාලය කුරුණෑගල නගරයේ පිහිටුවීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

## <u>2015 වර්ෂය තුල ඉටු කරන ලද විශේෂිත කාර්යයන්</u>

01. ගම්පහ කටාන කළුදියවලවත්ත ඉඩමෙන් පර්චස් 100 ක බිම් ප්‍රමාණය කටාන ප්‍රාදේශීය ලේකම් මගින් ලබා ගැනීම සහ එහි ආගමන හා විගමන නීති බලගැන්වීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීමේ මූලික කටයුතු ආරම්භ කිරීම. (ඉදි කිරීම් කටයුතු 2016 වසරේ ආරම්භ කිරීමට නියමිතය.)

02. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ මාණ්ඩලික නිලධාරී විවේකාගාරය පුළුල් කිරීමේ අරමුණින් නව තෙමහල් ගොඩනැගිල්ලක් සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් අදාල ගෘහ නිර්මාණ සැලසුම සකස් කර ගැනීමෙන් පසු ඉදි කිරීමට අවශ්‍ය සියළු අනුමැතීන් අදාල ආයතන මගින් ලබා ගැනීම. (ඉදි කිරීම් කටයුතු 2016 වසරේ ආරම්භ කිරීමට නියමිතය.)

03. බත්තරමුල්ල පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීම පිළිබඳ මූලික කටයුතු ඉටු කිරීම.

04. ත්‍රිකුණාමලයේ පිහිටා ඇති ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතු ඉඩමේ ආරක්ෂාව සඳහා සහ මායිම් නිරවුල් කර ගැනීම සඳහා ඉඩම වටා මායිම් තාප්පයක් ඉදි කිරීම පිණිස ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමග සම්බන්ධ වී මූලික සැලසුම් සකස් කර අවසන් කිරීම. (ඉදි කිරීම් කටයුතු 2016 වසරේ ආරම්භ කිරීමට නියමිතය.)

## 03 : 2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව

පාලක ජනරාල්වරයා නිල බලයෙන් ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ධූරය දරන අතර, පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) නිල බලයෙන් ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීම් නියෝජ්‍ය කොමසාරිස් වශයෙන් කටයුතු කරනු ලැබේ.


**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 01 |

ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දියානු සම්භවයක් සහිත පුද්ගලයින් ලියාපදිංචි කිරීම හා එම අය හට අවශ්‍ය වන අවස්ථාවලදී තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

### තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම 2011 – 2015

| පනත | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| 1988 අංක 39 | 71 | 14 | 09 | 19 | 48 |
| 2003අංක 35 | 04 | 08 | 02 | 03 | 02 |
| 2003 අංක 35 යටතේ දැනුම් දීමේ ලිපි නිකුත් කිරීම | 13 | - | 01 | - | - |



## 03 : 3 නීති ශාඛාව

පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක | 01 |
| බලයලත් නිලධාරීන් | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 02 |
| කාර්යාල සේවකයින් | 01 |

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නීති අංශය මගින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යානුබද්ධ අණ පනත් මගින් ලැබී ඇති නෛතික අධිකාරිය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදීමත්, අවශ්‍යතාවයන් අනුව අදාළ අණපනත් සංශෝධනය කිරීමට කටයුතු කිරිම මගින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරිමට සහායවේ.

### නීති ශාඛාවෙන් සිදුකරනු ලබන කාර්යයන්

1. දෙපාර්තමේන්තුවට අදාල නීතිමය ගැටළු සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
2. දෙපාර්තමේන්තුවට අදාල අණ පනත් සංශෝධනය කිරීමේදී ඊට අවශ්‍ය සහාය ලබාදීම.
3. විවිධ රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන වලින් දෙපාර්තමේන්තුවට සම්බන්ධ නීති රීති පිළිබඳව කරනු ලබන විමසීම් සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
4. විවිධ රාජ්‍ය ආයතන මගින් හා පෞද්ගලික ආයතන මගින් පවත්වාගෙන යන නඩු කටයුතු සඳහා අධිකරණ නියෝග යටතේ අවශ්‍ය කරන තොරතුරු හා ලේඛන ලබාදීමට කටයුතු කිරීම.
5. ආගාමික හා විගාමික පනත ඇතුළු දෙපාර්තමේන්තුවට අදාල අනෙකුත් අණ පනත්, නීති හා රෙගුලාසි උල්ලංඝණය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීම.
6. අධිකරණ මගින් පුද්ගලයන් විදේශ ගතවීම තහනම් කර ඇති අවස්ථාවලදී එම නියෝග ක්‍රියාත්මක කරවීම සඳහා සහාය දීම.
7. අධිකරණය ඉදිරියේ පවරා ඇති නඩු සම්බන්ධයෙන්, මෙම දෙපාර්තමේන්තු නිලධාරීන් සිතාසි මගින් එවැනි නඩු සඳහා කැඳවා ඇති අවස්ථාවලදී ඒ සඳහා අවශ්‍ය ලේඛන සකස් කොට නීතිමය උපදෙස් සමඟ එවැනි නිලධාරීන් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.
8. ආගාමික හා විගාමික පනත උල්ලංඝණය කරන තැනැත්තන් හඳුනාගැනීමෙන් අනතුරුව ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා අවශ්‍ය විමර්ශනයට උපදෙස් දීම හා එම විමර්ශන ප්‍රතිඵල වල කරුණු අනුව ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට කටයුතු කිරීම.

9. ආගමන හා විගමන පාලක ජනරාල්වරයා හෝ ඔහු වෙනුවෙන් රාජකාරී කරනු ලබන වෙනත් නිලධාරියෙකු විසින් කරනු ලබන රාජකාරී සම්බන්ධයෙන් ඔවුන් වගඋත්තරකරුවන් ලෙස නම් කොට ගොනු කරනු ලබන නඩු සම්බන්ධයෙන් නිරීක්ෂණ වාර්තා සකස් කොට අදාල අධිකරණ වෙත ඉදිරිපත් කොට ඔවුන් වෙනුවෙන් කරුණු දැක්වීමට පෙනී සිටීමත් අදාල නිලධාරීන් වෙනුවෙන් ගරු නීතිපති තුමා පෙනී සිටින අවස්ථාවල එතුමන්ට අවශ්‍ය සහයෝගය ලබාදීම.

10. මෙම දෙපාර්තමේන්තුව හා බාහිර පාර්ශ්වයන් අතර ඇතිකර ගනු ලබන කුලී නිවාස බදු ගිවිසුම් ඇතුළු විවිධ ගිවිසුම් සකස් කිරීම හා ඒවා අත්සන් කිරීම.

11. දෙපාර්තමේන්තුවට අදාල පනත් සම්බන්ධයෙන් අවශ්‍ය නියෝග/රෙගුලාසි අවශ්‍යතාවයන් අනුව සකස් කිරීමට කටයුතු කිරීම.

## 2015 වසර තුල නීති ශාඛාව විසින් ඉටුකරන ලද කාර්යයන්

1. දෙපාර්තමේන්තුව මගින් පවරා ඇති නඩු වලට අදාළ සිතාසි, වරෙන්තු කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගැනිම සහ එම සිතාසි, වරෙන්තු අවශ්‍ය පුද්ගලයන් වෙත යොමුකිරිමට කටයුතු කිරිම.

2. පාලක ජනරාල් හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුට අධිකරණය ඉදිරියේ සාක්ෂිදිම පිණිස සිතාසි යොමු කර ඇති අවස්ථාවන්හිදී එයට අදාළ තොරතුරු සහ ලිපිගොනු සකස් කර සුදුසු නිලධාරින් අදාළ දිනයන්හිදී අධිකරණ කටයුතු වලට සහභාගීවිම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරිම.

3. අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරිමට නොහැකි, තොරතුරු අසම්පූර්ණ අධිකරණ නියෝග සම්බන්ධ දැනුවත් කිරීමේ ලිපි 682 ක් අදාළ අධිකරණ වෙත යවා ඇත.

4. විශේෂ පොලිස් අපරාධ විමර්ශන ඒකක වලින් වංචා සම්බන්ධ විවිධ පුද්ගලයන්ගේ අදාල තොරතුරු විමසා එවා ඇති ලිපිවලට පිලිතුරු ලිපි 04 ක් යවා ඇත. තවද එවැනිම විවිධ පොලිස් ස්ථාන වලින් පුද්ගලයන්ගේ වංචා සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිවලට පිලිතුරු ලිපි 23 ක් යවා ඇත.

5. මානව හිමිකම් කොමිෂම් සභාවේ පැමිණිලි සඳහා දෙපාර්තමේන්තුව වගඋත්තරකරුවන් වශයෙන් නම්කර ඇති අවස්ථාවන් 8 කදී සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මගින් ඉල්ලා ඇති විමර්ශන සඳහා අවශ්‍ය තොරතුරු සහ සාක්ෂි ලබාදීම ද දෙපාර්තමේන්තුව වගඋත්තරකරුවන් කර ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති මූලික අයිතිවාසිකම් නඩු 4 ක් සම්බන්ධව ද නිරීක්ෂණ වාර්තා සකස් කර ඉදිරිපත් කර ඇත. නාරා ආයතනයේ නිලධාරිනියක් සම්බන්ධයෙන් එම ආයතනයේ පැවැත්වූ විනය පරික්ෂණයක් සඳහා පැමිණිල්ලේ සාක්ෂිකරුවකු වශයෙන් ද සාක්ෂි ලබාදිම.

6. දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නාවූ ගොඩනැගිලි, නිවාස සම්බන්ධව අදාළ පාර්ශ්ව අතර ඇති කරගන්නා බදු ගිවිසුම් සකස් කර අත්සන සඳහා යොමු කිරීම සහ අදාල ගිවිසුම් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම. (කොළඹ ප්‍රධාන කාර්යාලය, මහනුවර, ත්‍රිකුණාමලය, මාතර සහ මත්තල ප්‍රාදේශීය කාර්යාලයන්)

7. දෙපාර්තමේන්තුවේ කටයුතු වලට අදාළ වන්නාවූ කාර්යයන් සම්බන්ධ දේශීය ආයතන සමඟ දෙපාර්තමේන්තුව එළඹ ඇති ගිවිසුම් 20 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

8. ශ්‍රී ලංකා රජය හා අනෙකුත් රාජ්‍ය සමඟ ආගමන හා විගමන කටයුතු වලට අදාළ වීසා නිදහස් කිරීමට පදනම් වූ ද්විපාර්ශ්වික ගිවිසුම් 2 ක් සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

9. ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය තුල ජෛවමිතික භාවිතා කිරිමට හැකියාව ලබාදීම සඳහා 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරිමට කටයුතු කිරීම.

10. ජෛවමිතික ගමන් බලපත්‍ර සම්බන්ධ රෙගුලාසි සකස් කොට අනුමැතිය සඳහා නිති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට භාර දී ඇත.

11. විදේශ අමාත්‍යාංශයේ පැවති නැවත භාරගැනීම පිළිබඳ ජාතික සම්බන්ධිකරණ කමිටු (NCCR) රැස්වීමට සහභාගි වීම.

12. බ්‍රසල්ස් නුවර පැවැති නැවත භාරගැනීම පිළිබඳ ඒකාබද්ධ කමිටුව (JRC) නියෝජනය කිරිම.

13. නියමිත අවසරයකින් තොරව රැදී සිටින පුද්ගලයින් නැවත ඇතුල් කරගැනීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක සංධාන ඇති කිරීම පිළිබඳව යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව එළඹ ඇති ගිවිසුමට අනුකූලව පෝලන්තය සමඟ එළඹුන ක්‍රියාත්මක සංධානය පිළිබඳ ගිවිසුම අත්සන් කිරිම සඳහා අවසාන ගිවිසුම සැකසීමට පියවර ගෙන තිබිම.

**දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් 2015.01.01 සිට 2015.12.31 දක්වා නීති අංශය අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේදී / අධිකරණයේ පෙනී සිටින ලද වාර ගණන පිළිබඳ වාර්තාව**

| අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේදී සාක්ෂි දිම | අභියාචනාධිකරණයේ පවරන ලද නඩු | දෙපාර්තමේන්තුව මගින් පවරන ලද නඩු | අධිකරණයේදී සාක්ෂිදීම සඳහා පාලක ජනරාල්/ඔහුගේ නියෝජිතයකු කැඳවා ඇති විට අධිකරණයෙහි පෙනී සිටි වාර ගණන |
|---|---|---|---|
| **2** | **1** | **18** | **79** |

## 04. වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය

පාලක (වීසා හා ප්‍රත්‍යන්ත පාලන) ගේ අධීක්ෂණය යටතේ වීසා ශාඛාව, තොටුපල ශාඛාව හා විමර්ශණ ශාඛාව ක්‍රියාත්මක වේ.

**1948** අංක **20** දරණ ආගාමික හා විගාමික පනතේ III කොටස මගින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කරයි. ඒ යටතේ ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් සඳහා **1952** ආගමන හා විගමන රෙගුලාසි අංක **02** සිට අංක **35** ප්‍රකාරව වීසා බලපත් නිකුත් කිරීම හා වීසා දීර්ඝ කිරීම සිදු කරයි. ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින්ට මෙරට තුළ නීත්‍යානුකූලව රැදී සිටීම සඳහා වලංගු වීසා නිකුත් කිරීම මෙම ශාඛාව මගින් සිදු කෙරේ. වීසා නිකුත් කිරීමේ දී ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත වන බවට සහතික කරමින් ජාතික සංවර්ධනයට දායක වීම වීසා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වේ. තවද මෙම වසර තුල වීසා ආදායමේ පැහැදිලි වර්ධනයක් පෙන්වයි.

### 04 : 1 වීසා ශාඛාව

පාලක (වීසා) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලකවරු | 02 |
| සහකාර පාලක | 01 |
| බලයලත් නිලධාරීන් | 02 |
| සංවර්ධන නිලධාරී | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 29 |
| ගමන් බලපත්‍ර සහායක | 02 |
| කාර්යාල සේවකයින් | 08 |

### 2015 ප්‍රගතිය

2015.01.01 සිට 2015.12.31 වර්ෂය තුළ පූර්ව අනුමැතීන් ලබාදීම්, නව වීසා නිකුත්කිරීම් සහ දීර්ඝ කිරීම් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ඊ සංචරණ අනුමැතිය ලබාදීම (ETA) | **1,736,520** |
| 02 | නව වීසා නිකුත් කිරීම් (වාස වීසා) | **20,131** ✪ |
| 03 | වීසා දීර්ඝ කිරීම් - 1) වාස වීසා<br>2) සංචාරක වීසා | **23,220** ✪<br>**59,135** |
| 04 | සාර්ක් වීසා | **943** |
| 05 | ද්විත්ව පුරවැසි (ශ්‍රී ලාංකික) | **816** |
| **එකතුව** | | **1,840,765** |

✪ වර්ග අනුව සවිස්තරාත්මක තොරතුරු පහත දැක්වේ.

## වාස වීසා දීර්ඝ කිරීම් හා නිකුත් කිරීම් - 2015

## (අනු අංක 02 හා 03)

| කාණ්ඩය | දීර්ඝ කිරීම් | නිකුත් කිරීම් | තානාපති කාර්යාල වෙත යවනු ලැබූ ෆැක්ස් පණිවුඩ | ගුවන් තොටුපල වෙත යවනු ලැබූ පණිවුඩ (Landing Endorsement) |
|---|---|---|---|---|
| ආයෝජන මණ්ඩලවල සේවයේ නියුතු | 4,083 | 2,733 | 3,138 | 97 |
| ශ්‍රී ලාංකික දෙමාපියන්ගේ දරුවන් | 160 | 215 | | |
| පුරවැසි පනතේ 5.2 වගන්තිය යටතේ | | 1 | | |
| පුරවැසි පනතේ 5.1 වගන්තිය යටතේ | | 1 | | |
| පූජ්‍ය පක්ෂය | 925 | 293 | 226 | 35 |
| උසාවි නියෝග | 125 | 34 | | |
| රාජ්‍යතාන්ත්‍රික | 2 | 4 | 384 | 5 |
| කලින් ශ්‍රී ලාංකිකයින්ව සිටි | 2,244 | 1,727 | | |
| වෛද්‍ය හේතුන් මත පැමිණි | 362 | 383 | | |
| රාජ්‍ය නොවන සංවිධාන | 149 | 74 | 222 | 48 |
| රාජ්‍ය අංශයේ සේවයට පැමිණි | 567 | 475 | 636 | 30 |
| පුද්ගලික අංශයේ සේවයේ නියුතු | 2,639 | 4,333 | 1,405 | 135 |
| ලියාපදිංචි ඉන්දියානුවන් | 37 | | | |
| ආගමික කාර්යයන් සඳහා පැමිණි | 355 | 511 | 721 | 65 |
| දීර්ඝ කාලීන නේවාසික වීසා (වසර 5) (RGS) | 36 | 8 | | |
| ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ කලත්‍රයන් | 3,797 | 1,212 | | |
| SSRV (My Dream Home) | 137 | 67 | | |
| රාජකාරී | 3,416 | 3,632 | 2,603 | 179 |
| ශිෂ්‍ය / ශිෂ්‍යත්වලාභීන් | 4,186 | 4,428 | | |
| **එකතුව** | **23,220** | **20,131** | **9,335** | **594** |

## වීසා ශාඛාව මගින් සිදු කරන ලද විශේෂ කාර්යයන්

1. වීසා නිකුත් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයන්හි දී අනාවරණය වූ කරුණු වලට අදාලව හෝ ආගමන හා විගමන පාලක ජනරාල් වෙත ලැබුණු පැමිණිලි විභාගයෙන් අනතුරුව හෝ වීසා ලබා දීමට පාදක වූ ආයතන හා සම්බන්ධිත පුද්ගලයන්ගේ ඉල්ලීම් මත හෝ ලබා දී තිබූ වීසා නිසි විමර්ශනයක් පවත්වා අවලංගු කිරීම සහ අසාධු ලේඛන ගත කිරීම.

2. ජාතික ආරක්ෂාව පිළිබඳ විශේෂ තත්ත්ව යටතේ පාකිස්තානු, ඇෆ්ගනිස්ථාන්, ඊජිප්තු හා සිරියානු ජාතිකයින් මෙරටට පැමිණීමේදී රාජ්‍ය බුද්ධි අංශයට යොමු කර ආරක්ෂක නිෂ්කාශණ ලබා ගැනීම නොකඩවා සිදු කිරීම.

3. ශිෂ්‍ය වීසා ලබා ගනිමින් රටතුල සිටින මාලදිවයින් ශිෂ්‍යයින් , ඔවුන්ගේ යැපෙන්නන් හා භාරකරුවන් පසුගිය වර්ෂ කිහිපය තුළ විශාල ප්‍රමාණයකින් වර්ධනය වී තිබේ. සංචාරක වීසා ලබාගනිමින් පැමිණෙන මාලදිවයින් ශිෂ්‍යයන් හා යැපෙන්නන් මෙරටට පැමිණි පසු තම වීසා, ශිෂ්‍ය වීසා බවට පත්කරගැනීමට තිබූ හැකියාව ගැටළු මතු කරන්නක් බව පෙනුනි. පූර්ව අනුමැතියක් නොලබා රටට පැමිණි පසු ගාස්තු ගෙවීමකින් තොරව මාස තුනක් සංචාරක වීසා යටතේ සිට එක්වරම වාස වීසා සඳහා අයදුම්කිරීමෙන් සහ ඔවුන්ගේ පාඨමාලා පිළිබඳ කිසිදු අධිකාරියකින් නිර්දේශ ලබාගැනීමක් සිදු නොකිරීමෙන් මාලදිවයින් ශිෂ්‍ය වීසා අනුමැතිය සඳහා ගනු ලබන තොරතුරු ප්‍රමාණවත් නොවන  බව පැහැදිලිව පෙණිනි.  එහෙයින් තවදුරටත් මාලදිවයින් ශිෂ්‍ය වීසා නිකුත්කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති කඩිනමින් සකස් කළයුතු බව නිරීක්ෂණය කෙරේ. මේ යටතේ පූර්ණ කාලීන පාඨමාලා හදාරන්නන්ට පමණක් ශිෂ්‍ය වීසා නිකුත් කිරීම ක්‍රියාත්මක කළ අතර  ඒ සඳහා අදාල අධ්‍යාපන ආයතන මඟින් අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා විශේෂ දත්ත පෝරමයක් සකස් කරන ලදි. විදේශීය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට, භික්ෂුනීන් වහන්සේලාට හා වෛද්‍ය සිසුන්ට මෙතෙක් ගාස්තු රහිතව  වීසා ලබා දුන් අතර 2015 අප්‍රේල් මාසයේ සිට ගාස්තු අයකර වීසා ලබා දීම ආරම්භ කරන ලදි.  මෙය තුලින් වීසා අංශයේ සැලකිය යුතු ආදායම් වර්ධනයක් පෙන්නුම් කරයි.

4. නයිජීරියා, කෙන්යා, ගිනිබිසව්, සුඩාන්, ගැබෝ, උගන්ඩා, කොන්ගෝ යන රටවල පැතිරගිය එබෝලා වසංගතය හේතුවෙන් ඊසංචරණ ක්‍රියාවලිය මඟින් උක්ත රටවල වීසා ලබාගැනීම තාවකාලිකව අත්හිටවූ අතර, එම රටවල් වල ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල මඟින් පමණක් වීසා අයදුම්පත් භාර ගැනිණි. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් විටින් විට එබෝලා වෛරසය පැතිර ගිය රටවල එම අවධානම පහව ගොස් ඇති බවට දැනුම් දුන් අතර එම රටවලට පනවා තිබූ වීසා සීමා කිරීම ඉවත් කර සාමාන්‍ය තත්වයට පත් කරන ලදි.

5. අයදුම්පත් පරිලෝකනය කිරීමේ ක්‍රමවේදය පසුගිය වසර තුළද ක්‍රියාත්මක නොවූ බැවින්, එකතු වී තිබූ වීසා ගොනු ප්‍රමාණයන් තැන්පත් කිරීම සඳහා ඉඩකඩ ගැටළුව පැණ නැඟී තිබිණි.

6. වීසා ලබා දීම සඳහා 2015.09.01 දින සිට එක් දින සේවය ආරම්භ කිරීම හා 2015.12.07 දින සිට Business ETA on line හරහා අයදුම් කිරීම ආරම්භ කිරීම.  මෙය තුලින් ප්‍රධාන කාර්යාලය හා ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හරහාද, Business ETA තමන්ට හෝ තමා වෙනුවෙන් තුන්වෙනි පාර්ශ්වයකටද ලබා ගැනීමේ හැකියාව ලැබී ඇත.

7. වීසා ස්ටිකරය භාවිත කිරීම සඳහා ස්කෑනින් යන්ත්‍ර ස්ථාපිත කරන ලද අතර වීසා ස්ටිකර් මුද්‍රණය කරන ලදී. නිසි ප්‍රමිතියකින් යුත් ආරක්ෂිත ක්‍රමවේදයන් සමග වූ වීසා නිකුත් කිරීම සඳහා මෙය ඉවහල් වේ.

8. මෙතෙක් පැවති වීසා ක්‍රමවේදය සමාලෝචනය කර වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීමට පහත නම් සඳහන් නිලධාරීන් ඇතුලත් කමිටුවක් පත් කරන ලදී.

a. ඩබ්.ඒ.ඩී.යූ.නිශ්ශංක මහතා - සභාපති
(කොමසාරිස්, පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව)

b. වියානි ගුණතිලක මහතා - සාමාජික
(අතිරේක පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව)

c. රංජිත් විමලසූරිය මහතා - සාමාජික
(ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ)

d. ඩබ්.ඒ.ඩී.කරුණාතිලක මහතා - සාමාජික
(පාලක (පාලන), ආගමන හා විගමන දෙපාර්තමේන්තුව)

e. ඩබ්.එම්.එම්.බී.වීරසේකර මහතා - සාමාජික
(පාලක (වීසා), ආගමන හා විගමන දෙපාර්තමේන්තුව)

f. එම්.ඒ.පී.අයි.ගුණවර්ධන මහතා - සාමාජික
(නියෝජ්‍ය පාලක (වීසා), ආගමන හා විගමන දෙපාර්තමේන්තුව)

g. එම්.ටී.සෙයිනුල් රිලා මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව)

මෙම කමිටුව රැස්වීම් වාර 14ක් පවත්වා වීසා ක්‍රමවේදය සමාලෝචන වාර්තාවක් සකස් කරන ලදි.

9. 2015.09.01 දින සිට වීසා ලබා දීම සඳහා එක් දින සේවාව හඳුන්වා දීම.

10. ශාඛාවේ ප්‍රගති සමාලෝචන රැස්වීම සෑම මාසයකම අවස්ථා දෙකකදී පැවැත්වීම මඟින් පවතින අඩුපාඩු හා ගැටළු සාකච්ඡා කර විසඳා ගැනීම

## 04 : 2 තොටුපල ශාඛාව.

පාලක (වීසා) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලකවරු | 02 |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් | 30 |
| බලයලත් නිලධාරීන් | 313 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 09 |
| කාර්යාල සේවකයින් | 03 |


### අනුමත ඇතුල්වීමේ හා පිටත්වීමේ තොටුපල


1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල - කටුනායක
2. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල
3. කොළඹ ගුවන් තොටුපල - රත්මලාන
4. පලාලි ගුවන් තොටුපල
5. කොග්ගල ගුවන් තොටුපල
6. කොළඹ වරාය
7. ගාල්ල වරාය
8. මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය
9. ත්‍රිකුණාමල වරාය
10. කන්කසන්තුරේ වරාය
11. තලේමන්නාරම් ජැටිය
12. නොරොච්චෝලේ වරාය
13. ඔලුවිල් වරාය

## එක් එක් තොටුපලවල් හරහා පැමිණි හා පිටත් වූ පුද්ගලයින් සංඛ්‍යාව - 2015

| අනු අංකය | තොටුපල | පැමිණි සංඛ්‍යාව | පිටත් වූ සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|
| **1** | කටුනායක ගුවන් තොටුපල | 3,222,647 | 3,209,259 | **6,431,906** |
| **2** | හම්බන්තොට වරාය | 178 | 163 | **341** |
| **3** | මත්තල ගුවන් තොටුපල | 997 | 1,513 | **2,510** |
| **4** | කොළඹ වරාය | 6,786 | 7,474 | **14,260** |
| **5** | ගාල්ල වරාය | 20,339 | 18,474 | **38,813** |
| **6** | නොරොච්චෝලේ වරාය | 38 | 21 | **59** |
| **7** | ත්‍රිකුණාමලය වරාය | 917 | 877 | **1,794** |
| **8** | රත්මලාන ගුවන් තොටුපල | 2 | 2 | **4** |
| | **එකතුව** | **3,251,904** | **3,237,783** | **6,489,687** |


## එක් එක් තොටුපලවල් හරහා පැමිණි හා පිටත් වූ පුද්ගලයින් සංඛ්‍යාව - 2015




## ශ්‍රී ලංකාවට පැමිණි හා පිටවූ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව මාසිකව -2015

| | පැමිණි සංඛ්‍යාව | | | පිටවූ සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| මාසය | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශීය | පැමිණි මුළු සංඛ්‍යාව | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශීය | පිටත්වූ මුළු සංඛ්‍යාව |
| ජනවාරි | 107,562 | 165,428 | 272,990 | 109,948 | 193,429 | 303,377 |
| පෙබරවාරි | 86,378 | 171,136 | 257,514 | 97,162 | 172,144 | 269,306 |
| මාර්තු | 107,324 | 163,679 | 271,003 | 107,147 | 167,664 | 274,811 |
| අප්‍රේල් | 129,494 | 130,114 | 259,608 | 119,376 | 146,468 | 265,844 |
| මැයි | 109,073 | 120,467 | 229,540 | 110,293 | 126,517 | 236,810 |
| ජූනි | 110,075 | 122,535 | 232,610 | 101,124 | 113,023 | 214,147 |
| ජූලි | 123,064 | 183,779 | 306,843 | 102,720 | 145,038 | 247,758 |
| අගෝස්තු | 125,952 | 175,791 | 301,743 | 138,284 | 205,240 | 343,524 |
| සැප්තැම්බර් | 112,106 | 150,509 | 262,615 | 132,509 | 155,435 | 287,944 |
| ඔක්තෝබර් | 105,999 | 139,473 | 245,472 | 113,433 | 147,331 | 260,764 |
| නොවැම්බර් | 105,032 | 151,447 | 256,479 | 100,204 | 139,764 | 239,968 |
| දෙසැම්බර් | 140,345 | 215,142 | 355,487 | 124,547 | 168,983 | 293,530 |
| **එකතුව** | **1,362,404** | **1,889,500** | **3,251,904** | **1,356,747** | **1,881,036** | **3,237,783** |



# ලංකාවට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව කලාප අනුව - 2015

| මාසය | අප්‍රිකාව | ආසියාව | ඔස්ට්‍රේලියාව | යුරෝපය | උතුරු ඇමරිකාව | දකුණු ඇමරිකාව | හඳුනා නොගත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 1,367 | 73,791 | 7,333 | 73,873 | 8,623 | 371 | 70 | **165,428** |
| පෙබරවාරි | 1,055 | 78,487 | 4,277 | 79,564 | 7,322 | 344 | 87 | **171,136** |
| මාර්තු | 1,376 | 73,868 | 5,581 | 74,255 | 8,162 | 320 | 117 | **163,679** |
| අප්‍රේල් | 1,518 | 66,668 | 5,962 | 48,641 | 7,013 | 228 | 84 | **130,114** |
| මැයි | 1,235 | 75,369 | 4,438 | 32,347 | 6,697 | 265 | 116 | **120,467** |
| ජූනි | 1,144 | 71,660 | 6,454 | 34,991 | 7,980 | 215 | 91 | **122,535** |
| ජූලි | 1,512 | 90,790 | 6,554 | 75,528 | 9,010 | 320 | 65 | **183,779** |
| අගෝස්තු | 1,550 | 92,397 | 6,459 | 67,073 | 7,948 | 251 | 113 | **175,791** |
| සැප්තැම්බර් | 1,792 | 88,169 | 6,563 | 47,533 | 6,057 | 291 | 104 | **150,509** |
| ඔක්තෝබර් | 1,195 | 77,332 | 4,838 | 49,529 | 6,172 | 275 | 132 | **139,473** |
| නොවැම්බර් | 1,337 | 78,100 | 6,126 | 58,627 | 6,896 | 243 | 118 | **151,447** |
| දෙසැම්බර් | 2,526 | 100,065 | 15,502 | 83,656 | 12,858 | 431 | 104 | **215,142** |
| **එකතුව** | **17,607** | **966,696** | **80,087** | **725,617** | **94,738** | **3,554** | **1,201** | **1,889,500** |



## ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව තොටුපල අනුව - 2015

| තොටුපල | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපල | 107,316 | 86,174 | 107,128 | 129,321 | 108,657 | 109,835 | 122,874 | 125,702 | 111,933 | 105,776 | 104,814 | 139,856 | 1,359,386 |
| මත්තල ගුවන් තොටුපල | 99 | 43 | 35 | 22 | 33 | 56 | 63 | 52 | 45 | 60 | 35 | 37 | 580 |
| කොළඹ වරාය | 50 | 52 | 60 | 55 | 70 | 54 | 56 | 67 | 54 | 40 | 76 | 61 | 695 |
| ගාල්ල වරාය | 91 | 102 | 87 | 70 | 108 | 118 | 63 | 124 | 68 | 113 | 95 | 177 | 1,216 |
| ත්‍රිකුණාමලය වරාය | 6 | 7 | 14 | 26 | 205 | 12 | 8 | 7 | 6 | 10 | 12 | 214 | 527 |
| **එකතුව** | **107,562** | **86,378** | **107,324** | **129,494** | **109,073** | **110,075** | **123,064** | **125,952** | **112,106** | **105,999** | **105,032** | **140,345** | **1,362,404** |

## ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයින් සංඛ්‍යාව තොටුපල අනුව - 2015


| තොටුපල | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපල | 162,888 | 168,900 | 161,020 | 127,834 | 118,246 | 120,298 | 181,694 | 173,802 | 148,692 | 137,507 | 149,221 | 213,159 | 1,863,261 |
| හම්බන්තොට වරාය | 6 | 25 | 61 | 14 | 10 | 15 | 10 | 3 | 10 | 13 | 7 | 4 | 178 |
| මත්තල ගුවන් තොටුපල | 79 | 65 | 37 | 11 | 27 | 25 | 65 | 19 | 37 | 12 | 18 | 22 | 417 |
| නොරොච්චෝලේ වරාය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 10 | 25 | 3 | 38 |
| කොළඹ වරාය | 749 | 474 | 729 | 559 | 447 | 546 | 424 | 476 | 344 | 390 | 576 | 377 | 6,091 |
| ගාල්ල වරාය | 1,685 | 1,642 | 1,781 | 1,647 | 1,726 | 1,642 | 1,557 | 1,468 | 1,371 | 1,512 | 1,560 | 1,532 | 19,123 |
| රත්මලාන ගුවන් තොටුපල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 2 |
| ත්‍රිකුණාමලය වරාය | 21 | 30 | 51 | 49 | 11 | 9 | 29 | 23 | 55 | 29 | 38 | 45 | 390 |
| **එකතුව** | **165,428** | **171,136** | **163,679** | **130,114** | **120,467** | **122,535** | **183,779** | **175,791** | **150,509** | **139,473** | **151,447** | **215,142** | **1,889,500** |

# <u>රට තුළට ඇතුල්වීමට අවසර නොදුන් විදේශිකයන් (Refused entry) – 2015</u>

| ජාතිය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බංග්ලාදේශ් | 2 | | 2 | | 2 | 8 | | 1 | | | | 2 | 17 |
| ඉන්දියන් | 12 | 20 | 17 | 48 | 17 | 16 | 17 | 5 | 14 | 11 | 8 | 13 | 198 |
| ස්වීඩන් | 1 | | | | | | | | | | | | 1 |
| ටියුනීසියා | 2 | | | | | | | | | | | | 2 |
| පලස්තීන් | 1 | | | | | | | | | | | | 1 |
| කැමරූන් | 1 | | 2 | | | | | | | | | | 3 |
| පකිස්තාන් | 4 | 2 | | 6 | 17 | 4 | 5 | 5 | 5 | 3 | 30 | 23 | 104 |
| චීන | 3 | 2 | 4 | 1 | | 1 | 1 | 1 | 5 | 1 | 8 | 2 | 29 |
| ලෙබනන් | 4 | | | | | | | | | | | | 4 |
| ඇෆ්ගනිස්තාන් | 1 | | 11 | 4 | 11 | 4 | | 4 | 8 | 8 | 14 | 15 | 80 |
| රුසියන් | 1 | | | 3 | 3 | | | | 1 | 1 | | | 9 |
| ඉන්දුනීසියන් | 1 | | | | | | | | | | | | 1 |
| ප්‍රංශ | | 1 | | | | | | | 1 | | | 1 | 3 |
| සවුදිඅරාබි | | 1 | | | | | | | 1 | | | | 2 |
| කසකස්තාන් | | 1 | | | | | | | | | | | 1 |
| කිර්ගිස්තාන් | | 1 | | | | | | | | | | | 1 |
| ඕස්ට්‍රේලියන් | | 1 | | | | | | | | 1 | 1 | | 3 |
| හන්ගේරියන් | | 1 | | | | | | | | | | | 1 |
| නයිජීරියන් | | 1 | 2 | 1 | | | | | | | 1 | | 5 |
| ඇමෙරිකන් | | | 2 | | | | | | | | | | 2 |
| ඉරාන් | | | 3 | 1 | | 1 | | 1 | | 1 | | | 7 |
| අසර්බජාන් | | | 1 | | | | | | | | | | 1 |
| චෙක් රිපබ්ලික් | | | 1 | | | | | | | | | | 1 |
| ජර්මන් | | | 1 | | 1 | 2 | | 2 | | | | 1 | 7 |
| එක්සත් අරාබි එමීර් | | | 1 | | | | | | | | | | 1 |
| යුක්රේන් | | | 1 | 3 | | | | | | | | | 4 |
| ඉතාලි | | | | 2 | 1 | | | | | | | | 3 |
| බ්‍රිතාන්‍ය | | | | 1 | 1 | | | | 1 | | | 3 | 6 |
| අයිවරි කෝස්ට් | | | | 2 | | 4 | | | 1 | | | | 7 |
| හොංකොං | | | | 1 | | | | | | | | | 1 |
| මැඩගස්කර් | | | | | 1 | | | | | | | | 1 |
| නවසීලන්ත | | | | | 1 | | | | | | | | 1 |
| මාලදිවයින් | | | | | 1 | | | | | | | | 1 |


| ජාතිය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කැනේඩියන් | | | | 1 | 1 | | | | | | 1 | 1 | 4 |
| සියරා ලියෝන් | | | | | | 1 | | | | | | | 1 |
| තුර්කි | | | | | | 2 | | | | | | | 2 |
| මාලි | | | | | | 1 | | | | | | | 1 |
| සිරියන් | | | | | | 3 | | 2 | 3 | | | | 8 |
| සීෂෙල්ස් | | | | | | 1 | | | | | | | 1 |
| නේපාල් | | | | | | 13 | | | 13 | | | | 26 |
| තායිලන්ත | | | | | | 3 | | 3 | 1 | | 15 | | 22 |
| නෙදර්ලන්ත | | | | | | 1 | | 1 | | | | | 2 |
| ග්‍රීක් | | | | | | | | | 1 | | | | 1 |
| පිලිපීන | | | | | | | | | 1 | | | | 1 |
| ගානා | | | | | | | | | 1 | | | | 1 |
| චැඩ් | | | | | | | | | 4 | | | | 4 |
| ස්පාඤ්ඤ | | | | | | | | | | | 1 | | 1 |
| ඊජිප්තු | 1 | | | | | | | | | | 4 | 3 | 8 |
| මැලේෂියන් | | | | | | | | | | | | 1 | 1 |
| මියන්මාර් | | | | | | | | | | | | 1 | 1 |
| ඉරාක් | | | | | | | | 5 | | | | | 5 |
| **එකතුව** | **34** | **31** | **48** | **74** | **57** | **65** | **23** | **30** | **61** | **26** | **83** | **66** | **598** |

## <u>රට තුළට ඇතුල්වීමට අවසර නොදුන් විදේශිකයන් (Refused entry) – 2015</u>




<u>**නෞකා කාර්ය මණ්ඩල පැමිණීම - 2015**</u>

| | හම්බන්තොට වරාය | නොරොච්චෝලේ වරාය | කොළඹ වරාය | ගාල්ල වරාය | රත්මලාන ගුවන් තොටුපල | ත්‍රිකුණාමලය වරාය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 6 | 0 | 799 | 1,776 | 0 | 27 | 2,608 |
| පෙබරවාරි | 25 | 0 | 526 | 1,744 | 0 | 37 | 2,332 |
| මාර්තු | 61 | 0 | 789 | 1,868 | 0 | 65 | 2,783 |
| අප්‍රේල් | 14 | 0 | 614 | 1,717 | 0 | 75 | 2,420 |
| මැයි | 10 | 0 | 517 | 1,834 | 0 | 216 | 2,577 |
| ජූනි | 15 | 0 | 600 | 1,760 | 0 | 21 | 2,396 |
| ජූලි | 10 | 0 | 480 | 1,620 | 0 | 37 | 2,147 |
| අගෝස්තු | 3 | 0 | 543 | 1,592 | 0 | 30 | 2,168 |
| සැප්තැම්බර් | 10 | 0 | 398 | 1,439 | 0 | 61 | 1,908 |
| ඔක්තෝබර් | 13 | 10 | 430 | 1,625 | 0 | 39 | 2,117 |
| නොවැම්බර් | 7 | 25 | 652 | 1,655 | 2 | 50 | 2,391 |
| දෙසැම්බර් | 4 | 3 | 438 | 1,709 | 0 | 259 | 2,413 |
| **එකතුව** | **178** | **38** | **6,786** | **20,339** | **2** | **917** | **28,260** |



# <u>නෞකා කාර්ය මණ්ඩල පිටවීම - 2015</u>

| | හම්බන්තොට වරාය | නොරොච්චෝලේ වරාය | කොළඹ වරාය | ගාල්ල වරාය | රත්මලාන ගුවන් තොටුපල | ත්‍රිකුණාමලය වරාය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 19 | 0 | 726 | 1,644 | 0 | 16 | 2,405 |
| පෙබරවාරි | 10 | 0 | 573 | 1,634 | 0 | 16 | 2,233 |
| මාර්තු | 5 | 0 | 1,045 | 1,730 | 0 | 148 | 2,928 |
| අප්‍රේල් | 7 | 0 | 634 | 1,631 | 0 | 85 | 2,357 |
| මැයි | 79 | 0 | 529 | 1,546 | 0 | 226 | 2,380 |
| ජුනි | 13 | 0 | 575 | 1,467 | 0 | 38 | 2,093 |
| ජූලි | 6 | 0 | 497 | 1,507 | 2 | 50 | 2,062 |
| අගෝස්තු | 2 | 0 | 567 | 1,663 | 0 | 24 | 2,256 |
| සැප්තැම්බර් | 15 | 0 | 375 | 1,393 | 0 | 67 | 1,850 |
| ඔක්තෝබර් | 7 | 0 | 450 | 1,555 | 0 | 31 | 2,043 |
| නොවැම්බර් | 0 | 18 | 570 | 1,394 | 0 | 107 | 2,089 |
| දෙසැම්බර් | 0 | 3 | 933 | 1,310 | 0 | 69 | 2,315 |
| **එකතුව** | **163** | **21** | **7,474** | **18,474** | **2** | **877** | **27,011** |



## නාවිකයන් සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම - මාසිකව ආදායම 2015

| මාසය | නිකුත්කළ ස්ටිකර් ප්‍රමාණය | ආදායම (ඒකක වටිනාකම රු.1000/-) |
|---|---|---|
| ජනවාරි | 4256 | 4,256,000 |
| පෙබරවාරි | 3249 | 3,249,000 |
| මාර්තු | 4417 | 4,417,000 |
| අප්‍රේල් | 4049 | 4,049,000 |
| මැයි | 3362 | 3,362,000 |
| ජූනි | 4408 | 4,408,000 |
| ජූලි | 3390 | 3,390,000 |
| අගෝස්තු | 3509 | 3,509,000 |
| සැප්තැම්බර් | 3175 | 3,175,000 |
| ඔක්තෝබර් | 3511 | 3,511,000 |
| නොවැම්බර් | 3350 | 3,350,000 |
| දෙසැම්බර් | 4165 | 4,165,000 |
| **එකතුව** | 44841 | 44,841,000 |

## ගමන් බලපත්‍ර කුරියර් කිරීමට අනුමැතිය දීම - 2015

ශ්‍රී ලංකාව තුල තානාපති කාර්යාල පිහිටා නොමැති රටවලට ඇතුළුවීමට අවශ්‍ය වන පුද්ගලයන් හට එම රටවලට වීසා ලබා ගැනීම සඳහා තානාපති කාර්යාල පිහිටා ඇති වෙනත් රටකට ගමන් බලපත්‍ර යැවීම සඳහා අනුමැතිය ලබා දීමද තොටුපල ශාඛාවෙන් කරනු ලබයි. (උදාහරණයක් ලෙස නවසීලන්ත වීසා ලබා ගැනීම සඳහා ඉන්දියාවේ නවදිල්ලි නුවරට ගමන් බලපත්‍ර කුරියර් කරනු ලැබේ.)

2015 වසරේදී ගමන් බලපත්‍ර 28820 ක් දෙපාර්තමේන්තු අනුමැතිය යටතේ කුරියර් කිරීමට අවසර ලබා දී ඇති අතර, එක් ගමන් බලපතක් සඳහා රු.1000/- ක මුදලක් අය කරනු ලැබේ. එමගින් රු:28820000/- ක ආදායමක් උපයා ඇත.

## ගමන් බලපත්‍ර කුරියර් කිරීම 2014 - 2015

| වර්ෂය | 2014 | 2015 |
|---|---|---|
| ගමන් බලපත්‍ර ප්‍රමාණය | 26286 | 28820 |

## 04 : 3 විමර්ශන ශාඛාව

පාලක (වීසා) අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක | 02 |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් | 01 |
| බලයලත් නිලධාරීන් | 07 |

2015 වර්ෂය තුලදී විමර්ෂණයන් 42 ක් සිදුකර 86 දෙනෙකු සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කර ඇත.

**මිරිහාන කඳවුරට ඇතුළත් කරන ලද විදේශිකයන් රටින් ඉවත් කිරීම - 2015**

| ජාතිය | සංඛ්‍යාව |
|---|---|
| ආමේනියා | 1 |
| බංග්ලාදේශ | 44 |
| කැමරූන් | 1 |
| චීන | 49 |
| ප්‍රංශ | 2 |
| ජර්මන් | 1 |
| ඉන්දියානු | 39 |
| ඉරාන | 12 |
| ඉරාක | 13 |
| ඇෆ්ගන් | 1 |
| කසකස්ථාන | 1 |
| ලෙබනන් | 1 |
| මාලි | 1 |
| නයිජීරියානු | 5 |
| පාකිස්තානු | 41 |
| පලස්තියානු | 4 |
| රුසියානු | 4 |
| සිරියානු | 3 |
| සෝමාලියානු | 2 |
| තුර්කි | 1 |
| යුක්රේන | 6 |
| කොරියානු | 1 |
| තායිලන්ත | 10 |
| මැලේසියානු | 1 |
| ස්වීඩන් | 2 |
| ජෝර්ජියා | 3 |
| ඝානා | 3 |

| ජාතිය | සංඛ්‍යාව |
|---|---|
| නෙදර්ලන්ත | 1 |
| දකුණු අප්‍රිකානු | 1 |
| යේමන් | 1 |
| සුඩාන | 1 |
| අසර්බයිජානු | 1 |
| සිංගප්පූරු | 1 |
| උස්බකිස්තානු | 1 |
| **එකතුව** | **259** |

**එක්සත් ජාතීන්ගේ සරණාගතයන් සඳහා වන මහ කොමසාරිස් කාර්යාලයේ සම්බන්ධීකරණය යටතේ ශ්‍රී ලංකාවට නැවත පදිංචිය සඳහා පැමිණි සරණාගත ශ්‍රී ලාංකිකයන් - 2015**

| රට | පැමිණි සංඛ්‍යාව |
|---|---|
| ඉන්දියාව | 186 |
| ඉන්දුනීසියාව | 3 |
| එක්සත් රාජධානිය | 24 |
| ඕස්ට්‍රේලියාව | 51 |
| **එකතුව** | **264** |

**මානව වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය (NCHTRC) යටතේ පැවති පුහුණු වැඩසටහන් සඳහා දායකවීම්.**

- 2015 – 2019 මානව වෙළඳාම තුරන් කිරීම සඳහා වූ උපාය මාර්ගික සැලැස්මට දායකත්වය සැපයීම
- මානව වෙළඳාම සම්බන්ධව සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (S.O.P.) සඳහා දායක වීම
- 2015 පෙබරවාරි මස 25 වන දින ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ පැවති කලාපීය ආගමන විගමන නිලධාරීන් විසින් පැවැත්වූ සාකච්ඡාවට සහභාගි වීම. එහිදී අදාල රටේ දී වීසා උල්ලංඝනය කරන විදේශිකයන් සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීම.

## <u>ඉටු කරන ලද විශේෂිත කාර්යයන්</u>

1. ඔලුවිල් වරාය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා කාර්යාලයක් ලබාගැනීම.
2. කන්කසන්තුරය, මන්නාරම වරායන් සඳහා ආගමන හා විගමන කටයුතු සඳහා ආරම්භක පියවරක් ලෙස කාර්යාල, නේවාසිකාගාර සැකසීම වෙනුවෙන් අදාළ භූමි ප්‍රදේශ වෙන්කිරීමට අදාළ මූලික සැලසුම සැකසීම.
3. ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි හා බලයලත් නිලධාරි සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 05. තොරතුරු තාක්ෂණ අංශය

පාලක (තොරතුරු තාක්ෂණ) අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය**

| තනතුරු/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක (තොරතුරු තාක්ෂණ) | 01 |
| බලයලත් නිලධාරීන් | 05 |
| සංවර්ධන නිලධාරී | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 03 |
| ගමන් බලපත්‍ර සහායක | 03 |
| කාර්යාල සේවකයින් | 01 |

තොරතුරු තාක්ෂණ අංශයේ මූලික වගකීම වන්නේ දැනට පවත්නා මෘදුකාංග හා දෘඩාංග බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහ මහජනතාවට උපරිම සේවා පහසුව හා රජයට ප්‍රශස්ත පිරිවැයක් දැරෙන පරිදි නව ක්‍රමවේද හඳුන්වා දෙමින් තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම වේ.

එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සඳහා සේවා සපයන බාහිර ආයතන සමග නිසි පරිදි ගිවිසුම් යාවත්කාලීන කිරීම සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම ද මෙම අංශයේ තවත් කර්තව්‍යයක් වේ.

ඉහතින් දැක්වූ මූලික කාර්යය භාරයට අමතරව පහත දැක්වෙන විශේෂිත කාර්යයන්ද තොරතුරු තාක්ෂණ අංශය මගින් ඉටු කරනු ලැබිනි.

(1) 1. මහජන අවශ්‍යතා කෙරෙහි සංවේදි වෙමින් පවත්නා පරිගණක මෘදුකාංග මොඩියුලර් පහ සඳහා හඳුනාගත් වැඩිදියුණු කිරීම් සිදුකොට සේවා ඵලදායිතාව ඉහල නැංවීම.

2. දෙපාර්තමේන්තුව සඳහා බත්තරමුල්ලේ ඉදිවෙමින් පවතින නව ගොඩනැගිලි සංකීර්ණයෙහි පරිගණක පද්ධතිය මැනවින් ස්ථාපිත කිරීමෙහිලා අවශ්‍ය මූලික කටයුතු ඉටුකරදීම. සමස්ථ දත්ත පද්ධතිය සජීවීව පවත්වා ගනිමින් ඉටුකළ යුතු මෙම අභියෝගාත්මක කාර්යය නිවැරදිව ඉටු කිරීම වෙනුවෙන් සියළු පාර්ශවයන් සමග ඒකාබද්ධව සාකච්ඡා වට රාශියක් පවත්වමින් තීරණ ගැනීමට සිදු විය.

3. ජෛවමිතික ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ව්‍යාපෘතියෙහි පළමු අදියර 2015 වර්ෂයේ නිම කොට ක්‍රියාත්මක කිරීම හා එහි දෙවන අදියර 2016 වසරේ පළමු මාස තුන ඇතුලත නිම කිරීමට සැලසුම් කිරීම.

**(2) අස්ථානගත වූ සොරකම් කරන ලද ගමන් බලපත්‍ර ඒකකය (SLTD)**

අස්ථානගත වූ, සොරකම් කරන ලද ගමන් බලපත්‍ර පිළිබඳව පොලිස් ස්ථාන විසින් ලබා දෙන තොරතුරු මධ්‍යම තොරතුරු කාර්යාංශය හෝ විදේශ දූත මණ්ඩල කාර්යාල විසින් ඍජුවම හෝ දෙපාර්තමේන්තුව වෙත තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලැබේ. ඒවා විමර්ශනය කොට, එම ගමන් බලපත්‍ර නැවත පරිහරණය කළ නොහැකි පරිදි අවලංගු කර, ජාත්‍යන්තර පොලිසිය (INTERPOL) වෙත යවනු ලබයි. එවැනි ගමන් බලපත්‍රයක් මගින් වෙනත් පුද්ගලයෙකු විදේශගත වීම වැලැක්වීමට පියවර ගෙන ඇති අතර, එවැනි නීති විරෝධි කටයුතු සිදුවීම වැලැක්වීම (SLTD) පද්ධතියේ මූලික අරමුණ වේ.

2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා මධ්‍යම තොරතුරු කාර්යාංශය (NCB) හා විදේශිය දූත මණ්ඩල (SLDM) විසින් ගමන් බලපත්‍ර 7874 ක් දෙපාර්තමේන්තුවට එවා ඇති අතර ගමන් බලපත්‍ර 6709 ක් ජාත්‍යන්තර පොලිසියේ දත්ත පද්ධතියට යවා ඇත.

### (3) ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS)

ආගමන හා විගමන තොරතුරු හා සංඛ්‍යා ලේඛන ලබා දීම  සඳහා ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS) ස්ථාපනය කරන ලදි. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ තානාපති කාර්යාලයයන් සෘජුව සම්බන්ධතා පවත්වන්නේ මෙම අංශය සමග වන අතර අවශ්‍ය විටකදි වීසා නිකුත් කිරිමට පෙර විදේශ ගමන් බලපත්‍ර පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනිම මෙම අංශය හරහා කරනු ලබයි. 2015.01.01 සිට 2015.12.31 දින දක්වා අප දෙපාර්තමේන්තුව මගින් විමසුම් 2189 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

| අංකය | ආයතනය | එකතුව |
|---|---|---|
| 01 | ජර්මන් තානාපති කාර්යාලය | 222 |
| 02 | ප්‍රංශ තානාපති කාර්යාලය | 104 |
| 03 | නෝර්වේ තානාපති කාර්යාලය | 161 |
| 04 | ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය | 384 |
| 05 | නෙදර්ලන්ත තානාපති කාර්යාලය | 1 |
| 06 | ඇමරිකානු තානාපති කාර්යාලය | 86 |
| 07 | ඉතාලි තානාපති කාර්යාලය | 23 |
| 08 | ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය | 42 |
| 09 | කැනඩා මහ කොමසාරිස් කාර්යාලය | 52 |
| 10 | එක්සත් රාජධානි මහ කොමසාරිස් කාර්යාලය | 182 |
| 11 | ඉන්දියානු සහකාර මහ කොමසාරිස් කාර්යාලය | 1 |
| 12 | ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, බ්‍රිතාන්‍ය (බ්‍රිතාන්‍යයේ සිටින ශ්‍රී ලාංකිකයන් විසින් ගමන් බලපතක් අයදුම් කිරීමේදී ද අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර නිරවද්‍යතාවය තහවුරු කරගනු ලබයි) | 911 |
| 13 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය | 11 |
| 14 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 4 |
| 15 | තායිලන්ත තානාපති කාර්යාලය | 5 |
| | **එකතුව** | **2189** |

## 06. ගිණුම් අංශය

ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම අංශයේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | තනතුරු ගණන |
|---|---|
| ගණකාධිකාරී (ආදායම්) | 01 |
| ගණකාධිකාරී (ගෙවීම්) | 01 |
| පරිපාලන නිලධාරී (මුදල්) | 01 |
| අයවැය සහකාර | 01 |
| සංවර්ධන නිලධාරීන් | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 20 |
| සරප් නිලධාරීන් | 36 |
| කාර්යාල සේවකයින් | 06 |

### මූල්‍ය කළමනාකරණය


ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය මුදල් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වන මෙහි ආදායම් හා වියදම් පිළිබඳ කළමනාකරණය, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු නියමිත සීමාවන් තුළ පවත්වාගෙන යාම, භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික/ මාසික වාර්තාවන් (වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව, විසර්ජන ගිණුම, මාසික ගිණුම් සාරාංශ) පිළියෙල කර නියමිත දිනයන්හි භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම සහ මුදල් රෙගුලාසි වලට අනුකූලව මූල්‍ය කටයුතු මෙහෙයවීම මෙම අංශය තුලින් සිදුවන ප්‍රධාන කාර්යභාරය වේ.

### ආදායම් ඉලක්ක හා ප්‍රගතිය

2015 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත මුලු ආදායම් ඉලක්කය රුපියල් මිලියන 8,107 ක් වු අතර , උපයන ලද සත්‍ය ආදායම රුපියල් මිලියන 10,108 ක් විය. ඒ අනුව ඇස්තමේන්තු ගත ආදායම ඉක්මවන ආදායමක් වාර්තාකර ඇති අතර, එය අපේක්ෂිත ආදායම් ඉලක්කයට වඩා සියයට 25 ක වර්ධනයකි. එම ආදායම් වර්ධනයට හේතු වී ඇත්තේ අපේක්ෂිත ප්‍රමාණයට වඩා සංචාරකයින්ගේ පැමිණීම වැඩිවීම හේතුවෙන් විද්‍යුත් සංචරන වීසා (ETA) නිකුත් කිරීම් වැඩිවීම සහ ද්විත්ව පුරවැසි සහතිකපත් නිකුතුව කඩිනම් කිරීමත් ය.

**2015 වර්ෂයේ දෙපාර්තමේන්තුව ප්‍රධාන ආදායම් මූලාශ්‍ර තුළින් උපයන ලද ආදායම් පහත පරිදි වේ.**

| | | ආදායම (රුපියල්) |
|---|---|---|
| i. | ගමන් බලපත්‍ර නිකුත් කිරිම් හා සංශෝධන | 2,104,719,692.05 |
| ii. | විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍ර කටයුතු | 1,027,633,543.64 |
| iii. | තොටුපල කටයුතු | 74,065,000.00 |
| iv. | වීසා නිකුත් කිරීම්/ දීර්ඝ කිරීම් | 917,471,393.80 |
| v. | විද්‍යුත් සංචරන වීසා වැඩසටහන (ETA) | 5,133,896,060.00 |
| vi. | පුරවැසි අංශය | 850,008,800.00 |
| | **එකතුව** | **10,107,794,489.49** |



<u>**ආදායම් විශ්ලේෂණය 2011 – 2015**</u>


| | මුළු ගමන් බලපත්‍ර ආදායම | විදේශ දූත මණ්ඩල ආදායම් | තොටුපල | වීසා | විද්‍යුත් සංචරණ | පුරවැසි | මුළු ආදායම |
|---|---|---|---|---|---|---|---|
| 2011 | 2,064,103,335 | 963,519,650 | 35,885,000 | 595,177,260 | - | 105,972,500 | **3,764,657,745** |
| 2012 | 2,226,238,950 | 935,513,122 | 49,219,000 | 696,896,744 | 2,104,201,938 | 169,181,850 | **6,181,251,604** |
| 2013 | 2,092,488,502 | 1,062,648,099 | 71,397,000 | 751,379,693 | 3,510,925,846 | 35,253,730 | **7,524,092,870** |
| 2014 | 2,133,548,087 | 1,064,296,091 | 72,488,000 | 800,098,823 | 4,034,041,937 | 46,422,010 | **8,150,894,948** |
| 2015 | 2,104,719,692 | 1,027,633,544 | 74,065,000 | 917,471,394 | 5,133,896,060 | 850,008,800 | **10,107,794,490** |


✡ විද්‍යුත් සංචරණ පද්ධතිය 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය.

### 2015 වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම හා තත්‍ය වියදම

2015 වර්ෂයේ දි දෙපාර්තමේන්තු වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1,807.28 ක් විය. එයින් රුපියල් මිලියන 989.38 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන්ද රුපියල් මිලියන 817.90 ක් මූලධන වියදම් වෙනුවෙන්ද වෙන්කරන ලදී. 2015 වර්ෂයේ සමස්ථ තත්‍ය වියදම රුපියල් මිලියන 1,372.28 ක් වූ අතර එයින් රු.මිලියන 966.08 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් ද, රු.මිලියන 406.20 මූලධන වියදම් වෙනුවෙන් ද වැය කර ඇත.

## වියදම් සංයුතිය - 2015



## මූල්‍ය ප්‍රගතිය (වියදම්) - 2015 වර්ෂය

| වියදම් වර්ගීකරණය | මුළු ඇස්තමේන්තුව | සත්‍ය වියදම | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| | | | |
| **පුනරාවර්තන වියදම්** | **989,380,000** | **966,082,000** | **98** |
| පුද්ගල පඩිනඩි | 514,935,000 | 513,033,000 | **100** |
| ගමන් වියදම් | 27,850,000 | 23,653,000 | **85** |
| සැපයීම් | 36,950,000 | 31,800,000 | **86** |
| නඩත්තු වියදම් | 133,000,000 | 126,400,000 | **95** |
| ගිවිසුම්ගත සේවා | 264,400,000 | 260,166,000 | **98** |
| වෙනත් පුනරාවර්තන වියදම් | 12,245,000 | 11,030,000 | **90** |
| **මූලධන වියදම්** | **817,900,000** | **406,202,000** | **50** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම | 46,400,000 | 43,483,000 | 94 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 110,500,000 | 20,362,000 | 18 * |
| පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 5,000,000 | 4,225,000 | 85 |
| වෙනත් ආයෝජන | 656,000,000 | 338,132,000 | 52 ** |
| **මුළු එකතුව** | **1,807,280,000** | **1,372,284,000** | **76** |

* මිනුවන්ගොඩ රුඳවුම් මධ්‍යස්ථානය ඉදි කිරීමට එරෙහිව පැණනැගුණු මහජන විරෝධතාවය හේතුවෙන් ඉදි කිරීම් කටයුතු අත්හිටුවීමට සිදු වීමෙන් ප්‍රතිපාදන ඉතිරිවී ඇත.

** හිස් විදේශ ගමන් බලපත්‍ර ප්‍රසම්පාදනය සඳහා වූ ටෙන්ඩරය ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015 වර්ෂයේ ඔක්තෝම්බර්/ නොවැම්බර් මාස වලදී ලැබුණු බැවින් 2015 වසරේ ඇස්තමේන්තු කරන ලද 500,000 ක ප්‍රමාණය මිලදී ගැනීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.

## 07. පුරවැසි අංශය

1948 අංක 18 දරණ පුරවැසි පනතින් පුරවැසි අංශය සඳහා ව්‍යවස්ථාපිත බලය ලැබී ඇත. පුරවැසි පනත ක්‍රියාත්මක කිරීමේ විධායක නිලබලය ලැබෙන්නේ අදාළ රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම්වරයාටය. පුරවැසි පනතේ ප්‍රතිපාදන සහ විධායක ක්‍රියාපටිපාටි ආගාමික හා විගාමික පනතින් පාලනය වන විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සමඟ සෘජුවම සම්බන්ධ වන නිසා පුරවැසි අංශය ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ස්ථාන ගත කර ඇත. අමාත්‍යාංශ ලේකම්වරයාගේ විධායක බලතල සහකාර ලේකම්වරයෙකු මගින් ක්‍රියාත්මක වන අතර එම බලතල ද පුරවැසි අංශයේ නියෝජ්‍ය පාලකවරයකු මගින් ක්‍රියාත්මක වේ. සෙසු කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලකවරුන් | 02 |
| සංවර්ධන නිලධාරීන් | 01 |
| රාජ්‍ය කළමණාකරන සහකාරවරුන් | 26 |
| කාර්යාල කාර්ය සහයකවරුන් | 04 |

**කාර්යභාරය:**

**පුරවැසි අංශය මඟින් 1948 අංක 18 දරණ පුරවැසි පනතේ ප්‍රතිපාදන පහත සඳහන් මූලික කරුණු ඔස්සේ ක්‍රියාත්මක කරයි.**

❖ **පනතේ 5(2) වගන්තිය යටතේ පුරවැසිභාවය ලියාපදිංචි කිරීම.**

එක් අයකු හෝ දෙදෙනාම ශ්‍රී ලාංකිකයන් වන දෙමව්පියන්ට දාව විදේශ රටවල උපත ලැබූ දරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

❖ **පනතේ 8 වන වගන්තිය යටතේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය නැවත ප්‍රදානය කිරීම.**

විදේශ රටක පුරවැසිභාවය ලබාගැනීම හේතුවෙන් ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහිමි වූ තැනැත්තන්ට නැවත ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අත්පත් කර ගැනීමට අදාල කටයුතු ඉටු කරනු ලබයි.

❖ **පනතේ 11 වන වගන්තියට අදාළ කටයුතු කිරීම.**

මව හෝ පියා ශ්‍රී ලාංකික වන 5(2) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම අවුරුදු 22 දක්වා ඉටු කර ගැනීමට අපොහොසත් වන තැනැත්තකු මෙම වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි.

❖ **පනතේ 12 වන වගන්තියට අදාළ කටයුතු කිරීම.**

ශ්‍රී ලාංකික කලත්‍රයකු ආවාහ කර ගන්නා විදේශීය කාන්තාවන් සඳහා පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

❖ **<u>පනතේ 13 වන වගන්තියට අදාළ කටයුතු කිරීම.</u>**

සුවිශේෂී සමාජ සේවාවක් ඉටු කළ හෝ වෘත්තිමය, වාණිජමය කාර්මික හෝ කෘෂිකාර්මික අංශයන්හි නිපුනයෙකු වන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පුරවැසියකු වශයෙන් ජීවත්වීමේ අපේක්ෂාවෙන් පසුවන පුරවැසි පනතේ 11 වන වගන්තිය හා 12 වන වගන්තිය යටතේ පුරවැසිභාවය සඳහා හිමිකම් නොලබන තැනැත්තකු සඳහා ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

❖ **<u>පනතේ 13(අ) වන වගන්තිය අදාළ කටයුතු කිරීම.</u>**

වර්ෂ 5ක කාලයක් සඳහා වලංගු වීසා බලපත්‍රයක් හෝ පිටසනක් ප්‍රදානය කරනු ලැබ ඇති සහ විදේශ ආයෝජකයන් සහ වෘත්තිකයන් සඳහා ආණ්ඩුව විසින් අනුමත කරන ලද නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමයක ලියාපදිංචි කර ඇති යම් තැනැත්තෙකුට ලියාපදිංචියෙන් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබාදීමට අදාල කටයුතු සිදු කරනු ලබයි.

❖ **<u>පනතේ 19 වන වගන්තිය පරිදි ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම.</u>**

19(2) මගින්, විදේශ රටවල පුරවැසිභාවය ලබාගැනීම හේතුවෙන් ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහිමි වූ තැනැත්තකු එම රටවල පුරවැසිභාවය තිබියදීම ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

මෙහි 19(3) මගින් විදේශ රටවල වාස වීසා මගින් සිටින තැනැත්තන් සඳහා ශ්‍රී ලාංකික පුරවැසිභාවය තිබියදීම අදාල රට වෙත ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම.

❖ **<u>පනතේ 20 වන වගන්තියට අදාළ කටයුතු කිරීම.</u>**

20(1) වගන්තිය යටතේ 1948.11.15 දින හෝ එදිනට පෙර උපන් අයකු නම් සහ එම දිනය වන විට වෙනත් රටක ද පුරවැසියකු වන්නේ නම්, 1952.12.31 දින හෝ එම අයට වයස අවුරුදු 22ට පත්වන දින යන දින දෙකෙන් එම අය සම්බන්ධව පසුව එළඹෙන කවර වූ දිනයෙහි වෙනත් රටෙහි පුරවැසිභාවය එකී රටෙහි නීතියට අනුව අත්හැර නියමිත නිලධාරියාට දන්වන්නේ නම් මිස ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන්වීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සිදු කරයි.


20(2) වගන්තිය යටතේ යම් පුද්ගලයකු පරම්පරාවෙන් ලංකාවේ පුරවැසියකු වන්නා වූ සහ නීතිය ක්‍රියාත්මක වීමෙන්, ඔහුගේ උපත සිදු වූ අවස්ථාවේ දී හෝ ඉන් පසුව යම් වෙනත් රටක පුරවැසියකු වන්නා වූ විටක 1952.12.31 දින හෝ එලෙස වෙනත් රටක පුරවැසියකු වන්නා වූ දින සිට වර්ෂයක් ගතවී එළඹෙන්නා වූ දින හෝ වයස අවුරුදු 22 ට පත්වන දින යන දින වලින් එම අය සම්බන්ධයෙන් අන්තිමට එළඹෙන කවර දිනයක දී වෙනත් රටෙහි පුරවැසිභාවය එකී රටෙහි නීතියට අනුව අත්හැර නියමිත නිලධාරියාට දන්වන්නේ නම් මිස ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසාන වීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි.


20(3) වගන්තිය යටතේ පරම්පරාවෙන් ලංකාවේ පුරවැසියකු වන තැනැත්තකු ස්වේච්ඡාවෙන් වෙනත් රටක පුරවැසියකු වෙතොත් එම අයගේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අහෝසිවීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි.

20(4) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය නැවත අයදුම්කරන අයකු විසින් ස්වකීය විදේශ රටෙහි පුරවැසිභාවය මාස 03ක් ඇතුලත අත්නොහරින්නේ නම් ඔහුගේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහෝසි කිරීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි.

**පුරවැසි පනත අනුව 2015.01.01 සිට 2015.12.31 දක්වා නිකුත් කරන ලද සහතික**

| වගන්තිය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | මුද්‍රණය කළ සහතික පත් සංඛ්‍යාව |
|---|---|---|
| 5(2) | 7385 | 7320 |
| 8 | 30 | 01 |
| 11 | 70 | 48 |
| 12 | 10 | 16 |
| 19(2)/ 19(3) | 17109 | 4373 |
| 20 | 72 | 72 |




## 2015 වර්ෂය තුල ඉටු කරන ලද විශේෂිත කාර්යයන්, ජයග්‍රහණ හා අභියෝග

❖ 1948 අංක 18 පනතේ 19 වගන්තිය යටතේ ද්විත්ව පුරවැසිභාවය ලබාදීම නව ක්‍රමවේදයක් යටතේ 2015.03.23 දින ආරම්භ කරන ලදී. ඒ අනුව 2015 වර්ෂය තුල පිරිනමන ලද සහතිකපත් ප්‍රමාණය පහත දැක්වේ.

| පවත්වන ලද දිනය | පවත්වන ලද ස්ථානය | පිරිනමන ලද සහතිකපත් ප්‍රමාණය |
|---|---|---|
| 2015.04.30 | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව | 180 |
| 2015.06.11 | විදේශ කටයුතු අමාත්‍යාංශ ශ්‍රවණාගාරය | 412 |
| 2015.11.17 | අරලියගහ මන්දිරය | 2538 |
| | එකතුව | 3130 |

# 8. අභ්‍යන්තර විගණන අංශය

ගණකාධිකාරී (අභ්‍යන්තර විගණක) අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2015**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | 02 |

## අරමුණු

දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමය සම්බන්ධයෙන් සොයා බලා එම කටයුතුවල වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම.

## අභ්‍යන්තර විගණන කාර්යයන්

- ✓ වැරදි හා වංචා වැළැක්වීම සඳහා දෙපාර්තමේන්තු තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන්ම තත්‍ය ක්‍රියාකාරිත්වය අතින් සාර්ථක දැයි සොයා බැලීම.
- ✓ ගිණුම් සහ වෙනත් වාර්තා වල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
- ✓ කාර්ය මණ්ඩලයට පවරා ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්ය සාධනයෙහි ගුණාත්මකතාව ඇගයීම.
- ✓ දෙපාර්තමේන්තුවේ වත්කම්, සියළුම ආකාරයේ අලාභ හානිවලින් කොතරම් දුරට ආරක්ෂා කර ඇත්දැයි සොයා බැලීම.

- ✓ රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය විසින් සහ භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කර ඇති පරිපූරක උපදෙස් ද පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.

- ✓ නාස්තිය, නිස්කාර්ය ධාරිතාව සහ පමණ ඉක්මවා කෙරෙන වියදම් වැළැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට තෝරාලනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

- ✓ දෙපාර්තමේන්තුවේ ගිණුම් පරිපාටිය සහ කිසියම් මුදල් වැයවීමකට තුඩුදෙන එකී මෙහෙයුම් පරීක්ෂා කිරීම සහ දෙපරේතමේන්තුවේ දේපළ හා වත්කම ආරක්ෂාකාරී ලෙස අරපිරිමැස්මෙන් යුතුව විධිමත් ලෙස පරිහරණය කරන්නේදැයි සොයා බැලීම.

## 2015 වර්ෂය තුළ සිදු කළ කාර්යයන්

- 2015 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ හා ක්ෂේත්‍ර සම්බන්ධව සිදු කරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් තුළින් අනාවරණය කර ගත් කරුණු සම්බන්ධව විගණන නිරීක්ෂණ වාර්තා 18 ක් ඉදිරිපත් කර ඇත.

- 2015 වර්ෂය තුළ පැවැත්වියයුතු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතර (04) පවත්වා ඇත.

- විගණකාධිපති විසින් 2015 වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 16 කට අදාළ පිළිතුරු සැපයුම සම්බන්ධීකරණ කිරීම.

# 09. සුභසාධන කටයුතු

## සුභසාධක සංගමය විසින් 2015 වර්ෂයේ දී සිදුකරන ලද විශේෂ කාර්යයන්

දහසක පමණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකත්වයකින් යුත් ආගමන හා විගමන සුභසාධක සංගමය, සාමාජිකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයගේ සහ පොදුවේ මුළුමහත් සමාජයේ සුභසිද්ධිය උදෙසා ආගමික, සාමාජීය හා සංස්කෘතිකමය වශයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ තුලින් කායික හා මානසික වශයෙන් නිරෝගීමත් සේවක පිරිසක් බිහිකරමින්, ඔවුන්ගේ කාර්යක්ෂම හා තෘප්තිමත් සේවාව තුලින් මහජනතාවට වඩාත් ගුණාත්මක සේවයක් ලබාදීම අරමුණයි.

| අනු අංක | දිනය | වැඩසටහන |
|---|---|---|
| 1 | 2015/01/01 | නව අවුරුදු උත්සවය, පසුගිය වසරේ ඵලදායි ලෙස සේවය කරන ලද දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් ඇගයීමට ලක් කිරීම. හා 2014 වර්ෂයේ රාජ්‍ය කෙටි නාට්‍ය උළෙලේ අප දෙපාර්තමේන්තුවේ ඉදිරිපත් කිරීමක් වූ හොඳම නාට්‍ය ඇතුළු සම්මාන රැසක් දිනාගත් “රන් සපත්තුව” ඇගයීමට ලක් කර සම්මාන පිරිනැමීම සිදුකරන ලදී. |
| 2 | 2015/01/01 | ටෙන්ඩර් ලබාදීම මගින් ආපනශාලාව දීර්ඝ කාලීනව පවත්වාගෙන ආ නමුදු එහි ගුණාත්මක බව හා පිරිසිදු බව ආදිය සලකා තවදුරටත් ටෙන්ඩර් කරුවන්ට ආපනශාලාව ලබාදීමේ ඵලක් නොවන බැවින් දෙපාර්තමේන්තුවේ සුභ සාධක සංගමයට සේවකයින් බඳවාගෙන සියලුම ද්‍රව්‍යයන් සුභ සාධක සංගමයෙන් ලබාදී ආපනශාලාව පවත්වාගෙන යාම ආරම්භ කරන ලදී. මෙහි විශේෂත්වය වන්නේ ශරීරයට අහිතකර කිසිදු රසකාරකයක් ආපනශාලාවේ භාවිතයට ගැනීම සඳහා සංගමය මගින් නොයෙදීමයි. |
| 3 | 2015/02/03 | නවලෝක රෝහල සමඟ එක්ව දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලය සඳහා වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම. |
| 4 | 2015/03/11 | කොළඹ අක්ෂි රෝහලේ තාක්ෂණ ශිල්පීන් ගේ සහභාගීත්වයෙන් කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් සඳහා අක්ෂි ග්ලූකෝමා පරික්ෂණය සිදුකිරීම හා ඊට සමගාමීව අක්ෂි සායනයක් පවත්වා පහසු මිළට ඇස් කණ්ණාඩි ලබා ගැනීමට සැලසීම. |
| 5 | 2015/04/10 | අප කාර්යය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූවාදරුවන් සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ කුරුළු විද්‍යා අංශයේ අරුණ පද්මපෙරුම මහතා හා කාර්යය මණ්ඩලයේ සහභාගිත්වයෙන් කොළඹ ජාතික ස්වභාවික කෞතුකාගාරයට අධ්‍යාපන චාරිකාවක් රැගෙන යාම. |
| 6 | 2015/05/16 | දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ අතර සුහද ක්‍රිකට් තරඟාවලිය බන්ධනාගාර ක්‍රීඩාංගණයේ පවත්වන ලදී. එහිදී බලයලත් නිලධාරීන්ගේ කණ්ඩායම විසින් ජයග්‍රහණය කරන ලදී. |

| අනු අංක | දිනය | වැඩසටහන |
| --- | --- | --- |
| 7 | 2015/06/08 | පොසොන් පොහොයට සමගාමීව කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලට ඉතා වටිනා Emergency Drug trolley 2 ක් පරිත්‍යාග කිරීම. |
| 8 | 2016/07/29 | රාජ්‍ය සේවා ක්‍රිකට් තරඟාවලියේ පෙරහුරු තරඟාවලියක් ලෙස බැඩ්මින්ටන් තරඟාවලිය පී. සරවනමුත්තු ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී. |
| 9 | 2016/09/05 | වාර්ෂික සුහද හමුව දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් පී. සරවනමුත්තු ක්‍රිඩාංගණයේදී පවත්වන ලදී. |
| 10 | 2015/12/05 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වෙළඳ සේවය සමඟ එක්ව ගීත ගායන හැකියාව ඇති කාර්යය මණ්ඩල සමාජිකයින්ගේ සහභාගිත්වයෙන් සේවක සංග්‍රහය වැඩසටහන පැවැත්වීම. |
| 11 | 2015/12/29 | කාර්යය මණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සමාජිකයින්ගේ සහභාගිත්වයෙන් වසර අවසාන සතුටු සාදය බත්තරමුල්ල "අපේගම" පරිශ්‍රයේදී පවත්වන ලදී. |
| 12 | 2015/12/30 | 2015 වසර තුල විශ්‍රාම ලැබූ හා ස්ථානමාරුවී යන නිලධාරීන් හට සුභ පැතීමේ උත්සවය පැවැත්වීම. |